ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,344 — 2004 ජූනි මස 04 වැනි සිකුරාදා— 2004.06.04

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

විභාග, විභාග ප්‍රතිඵල ආදිය

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය
ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ II වැනි පංතියේ II වැනි ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත/සීමිත තරඟ විභාගය - 2004

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය යටතේ ඇති කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ II වැනි පංතියේ II වැනි ශ්‍රේණියේ මෙහි පහත 02 ඡේදයේ සඳහන් තනතුරු සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

මෙම නිවේදනය අවසානයේ ඇති ආදර්ශ අයදුම් පත්‍රය අනුව A4 ප්‍රමාණයේ කඩදාසිවල දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් පිලියෙල කරනු ලබන අයදුම්පත් 2004.07.16 වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ "කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, කැ.පෙ. 01. පේරාදෙණිය" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් පමණක් එවිය යුතුය. ඉල්ලුම්පත් බහා එවනු ලබන ලියුම් කවරයේ වම් පස ඉහළ කෙළවරේ "ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයට බඳවා ගැනීම සඳහාවූ තරඟ විභාගය - 2004" යන්න සඳහන් කර තිබිය යුතුය. අයදුම්පත්‍ර භාරගන්නා අවසාන දිනට පසුව ලැබෙන කිසිම අයදුම්පත්‍රයක් භාර ගනු නොලැබේ. සීමිත තරඟ විභාගයට පෙනී සිටින අයදුම්කරුවන් තම අයදුම්පත්‍රය ඒකකය භාර අධ්‍යක්ෂ/පළාත් සහාවක නම් කෘෂිකර්ම විෂය භාර අමාත්‍යාංශයේ ලේකම් මගින් එවිය යුතුය.

සැලකිය යුතුයි :

(අ) මෙම නිවේදනයේ අවසානයේ ඇති ආදර්ශ ආකෘතියට අදාළ නොවන සෑම ආකාරයකින්ම සම්පූර්ණ නොවන සහ අවිධිමත් ඉල්ලුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. දෙපාර්තමේන්තුවේ හෝ අමාත්‍යාංශයේ නිලධාරීන්ගේ නමට අයදුම්පත් නොඑවිය යුතුය. යම් ඉල්ලුම්පතක් තැපෑලේදී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට කරන පැමිණිලි කිසිවක් සලකා බලනු නොලැබේ.

(ආ) ඉල්ලුම්පත් ලද බව දන්වනු නොලැබේ. අයදුම්කරුවන්ට විභාගයට පෙනී සිටීම සඳහා වූ ප්‍රවේශ පත්‍ර නිකුත් කළ විගසම, පුවත්පත්වල දැන්වීමක් පළ කරනු ලැබේ. විභාග දිනට දින හතකටවත් කලින් ප්‍රවේශ පත්‍ර නොලබන අපේක්ෂකයෙකු පහත සඳහන් විස්තර ඇතිව වහාම විභාග කොමසාරිස් ජනරාල්, විභාග දෙපාතමේන්තුව, පැලවත්ත, බත්තරමුල්ල යන ලිපිනයට දැන්විය යුතුය. විදුලි පණිවුඩ සඳහා ලිපිනය 'විභාග' පැලවත්ත, බත්තරමුල්ල වේ.

(i) විභාගයේ නම :————.
(ii) අපේක්ෂකයාගේ සම්පූර්ණ නම :————.
(iii) ලිපිනය :————.
(iv) ඉල්ලුම්පත් තැපැල් කළ දිනය, ලියාපදිංචි අංකය හා තැපැල් කාර්යාලය :————.

02. පුරප්පාඩු පවතින තනතුරු :
01. කෘෂිකර්ම නිලධාරි
02. පර්යේෂණ නිලධාරි
03. කථිකාචාර්ය (දෙමළ මාධ්‍ය)
04. කෘෂි ආර්ථික විද්‍යාඥ

සටහන :-

(i) සීමිත තරඟ විභාගය පැවැත්වෙනුයේ කෘෂිකර්ම නිලධාරි, පර්යේෂණ නිලධාරි හා කෘෂි ආර්ථික විද්‍යාඥ තනතුරුවලට පමණකි.

03. *සේවයේ නියුක්ත කරවීමේ නියමයන් හා කොන්දේසි.-*

(i) මෙම තනතුරු ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. 2003.01.01 දින හෝ ඊට පසුව නව ප්‍රවේශකයෙකු ලෙස මෙම තනතුරට බඳවා ගනු ලබන නිලධාරියෙකු රජය විසින් වරින් වර නියම කරනු ලබන ප්‍රතිශතයක් අනුව දායක විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.

ව්‍යතිරේකය :
2003.01.01 දිනට පෙර විශ්‍රාම වැටුප් සහිත තනතුරක් දැරූ අයෙකු මෙම තනතුරට බඳවා ගනු ලැබුවහොත් එවැනි අයෙකුට තවදුරටත් විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුපක් සඳහා හිමිකම් ඇති අතර, වැන්දඹු අනත්දරු / වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.

(ii) මෙම පත්වීම් තුන් අවුරුදු පරිවාස කාලයකට යටත් වනු ඇත. දැනටමත් රජයේ සේවයේ ස්ථිර කර සිටින අයදුම්කරුවෙකු තෝරා ගනු ලැබුවහොත් ඔහු / ඇය එක් වර්ෂයක පරීක්ෂණ කාලයකට යටත් කරනු ලැබේ.

(iii) තෝරා ගනු ලබන අපේක්ෂකයින් දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට එකඟ විය යුතුය.

(iv) මෙම පත්වීම් 2002.05.08 වැනි දින අංක 1235/21 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ හා එහි මින් මතු කෙරෙන සංශෝධනවලටද යටත්ව සිදුවේ. ආයතන සංග්‍රහයේ ii පරිච්ඡේදයේ 10 හා 12 ඡේද ද අදාළ වේ.

(v) මෙම *ගැසට් පත්‍රයේ* i වැනි කොටසේ (iiඅ) වැනි ඡේදයෙහි දක්වා ඇති රාජ්‍ය සේවා තනතුරු සඳහා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි කෙරෙහි අවධානය යොමු කරනු ලැබේ.

04. *ව්‍යුහය හා වාර්ෂික වැටුප් පරිමාණය* - මෙම තනතුරුවලට හිමි ඒකාබද්ධ වාර්ෂික වැටුප් පරිමාණයන් පහත සඳහන් පරිදි වේ.

ii වැනි පංතිය ii වැනි ශ්‍රේණිය
රු.1,12,500 - 15x 2,700 - රු.1,53,000
ii වැනි පංතිය i වැනි ශ්‍රේණිය
රු.1,53,540 - 2 x 5,520-5 x 6,120 - රු.1,95,180
i වැනි පංතිය
රු. 1,97,520 - 10 x 9,000 - රු. 2,87,520

05. *බඳවා ගැනීමේ ක්‍රමය.-* විභාග කොමසාරිස් ජනරාල් විසින් සීමිත හා විවෘත අපේක්ෂකයින් වෙනුවෙන් පොදු තරඟ විභාගයක් පවත්වනු ලැබේ. මෙම තරඟ විභාගයේදී සියළුම අයදුම්කරුවන් මෙම නිවේදනයේ 13 වන ඡේදයේ සඳහන් පොදු ප්‍රශ්න පත්‍රයට සහ විෂයානුබද්ධ ප්‍රශ්න පත්‍ර අතරින් තමා ඉල්ලුම් කරන තනතුරට අදාළ ප්‍රශ්න පත්‍රවලට අනිවාර්යයෙන් පෙනී සිටිය යුතුය. එකී පොදු තරඟ විභාගයේ ප්‍රතිඵල මත මෙහි පහත දක්වා ඇති විධිවිධානවලට අනුකූලව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බඳවා ගැනීම් සිදුකරනු ලැබේ.

06. *විවෘත තරඟ විභාගය.-*

(අ) කථිකාචාර්ය, තනතුරට පත් කරනු ලබන්නේ විවෘත බඳවා ගැනීම් තුළින් පමණි. කෘෂි ආර්ථික විද්‍යාඥ තනතුරුවල පුරප්පාඩු සංඛ්‍යාවෙන් 80% ක්ද, පර්යේෂණ නිලධාරි තනතුරුවල පුරප්පාඩු සංඛ්‍යාවෙන් 60% ක්ද, කෘෂිකර්ම නිලධාරි තනතුරුවල පුරප්පාඩු සංඛ්‍යාවෙන් 33 1/3% ක්ද, විවෘත බඳවා ගැනීම් මගින් පුරවනු ලැබේ. එහෙත් මෙකී තනතුරුවලට සීමිත බඳවා ගැනීම් තුළින් පත් කිරීම සඳහා 07 ඡේදය යටතේ වේන් කර ඇති ප්‍රතිශතයනට සරිලන සංඛ්‍යාවක් එසේ පත්කර ගැනීමට නොහැකි වන අවස්ථාවලදී ඉතිරි වන පුරප්පාඩු සංඛ්‍යාවද විවෘත බඳවා ගැනීම් තුළින් පුරවනු ලැබේ.

(ආ) එක් අයදුම්කරුවෙකුට ඉල්ලුම් කිරීමට අවකාශ ඇත්තේ සිය මනාපය පරිදි උපරිම වශයෙන් 02 ඡේදයේ දක්වා ඇති තනතුරු අතරින් දෙකක් සඳහා පමණි.

(ඇ) 13 වන ඡේදයේ යටතේ නියමිත සෑම ප්‍රශ්න පත්‍රයකටම 50% ක් හෝ ඊට වැඩි ලකුණු සංඛ්‍යාවක් ලබා ගත් අපේක්ෂකයින් විසින් අයදුම්පතේ සඳහන් කර ඇති මනාපයන්ද සැළකිල්ලට ගෙන, ඔවුන් ලබා ගන්නා ලකුණු සංඛ්‍යාවේ එකතුවෙහි උපරිම අනු පිළිවෙල පදනම් කර ගනිමින් එක් එක් තනතුර සඳහා සකස් කරන කුසලතා ලැයිස්තුව අනුව, එකී තනතුරුවල පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයකට නොවැඩි සංඛ්‍යාවක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ.

(ඈ) තරඟ විභාගයේ නියමිත ප්‍රශ්න පත්‍රවලට ලබා ගන්නා මුළු ලකුණු සංඛ්‍යාවේ උපරිම අනුපිළිවෙල මත බඳවා ගැනීම් සිදු කරනු ඇත.

06.1 *වෙනත් සුදුසුකම් :*

(අ) සියළුම අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතුය.

(ආ) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 22 ට නොඅඩු විය යුතු අතර උපරිම වයස අවුරුදු 30ට නොවැඩි විය යුතුය. එහෙත් ඒ දිනට රාජ්‍ය සේවයේ නිරත නිලධාරීන් සම්බන්ධයෙන් උපරිම වයස් සීමාව අවුරුදු 40 ක් වේ.

(ඇ) එක් අයදුම්කරුවෙකුට අවස්ථා තුනක් පමණක් විවෘත විභාගයට පෙනීසිටිය හැක.

(ඈ) මනා ශරීර සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතු අතර, ඒ බව වෛද්‍ය පරීක්ෂණ වාර්තාවක් මගින් සනාථ කළ යුතුය.

06.2 *අධ්‍යාපනික සුදුසුකම් :*

මෙහි පහත i හා ii යටතේ දැක්වෙන ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ ii වැනි පංතිය ii වැනි ශ්‍රේණියේ උපලේඛණගත තනතුරු සඳහා අයදුම් කිරීම පිණිස පහත දක්වා ඇති සුදුසුකම් සපුරා තිබිය යුතුය.

(i) කෘෂිකර්ම නිලධාරි, කථිකාචාර්ය සහ කෘෂි ආර්ථික විද්‍යාඥ තනතුරු,

(අ) පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් කෘෂිකර්ම විද්‍යාව පිළිබඳ සිව් අවුරුදු උපාධිය ; හෝ

(ආ) පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් තුන් අවුරුදු කෘෂිකර්ම විද්‍යා උපාධිය සහ නිබන්ධයක් සහිතව පිළිගත් විශ්ව විද්‍යාලකින් ලබාගත් දෑ අවුරුදු පශ්චාත් උපාධියක් සමත්වී තිබීම

(ii) *පර්යේෂණ නිලධාරි තනතුර -*

(අ) පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් කෘෂිකර්ම විද්‍යාව පිළිබඳ සිව් අවුරුදු උපාධිය ; හෝ

(ආ) පිළිගත් විශ්ව විද්‍යාලයකින් උද්භිද විද්‍යාව, රසායන විද්‍යාව හෝ සත්ත්ව විද්‍යාව පිළිබඳ සිව් අවුරුදු විද්‍යා උපාධිය ; හෝ

(ඇ) පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් තුන් අවුරුදු කෘෂිකර්ම විද්‍යා හෝ විද්‍යා උපාධිය සමග පහත සඳහන් විෂයයන්ගෙන් කවර හෝ එක් විෂයයක් පිළිබඳව පිළිගත් විශ්ව විද්‍යාලයකින් නිබන්ධනයක්ද සහිතව දෑ අවුරුදු පශ්චාත් උපාධියක් ලබා තිබීම.

i. ව්‍යාධිවේදය
ii. කීට විද්‍යාව
iii. පාංශු විද්‍යාව
iv. ක්ෂුද්‍ර ජීව විද්‍යාව
v. කෘෂිකර්ම ඉංජිනේරු විද්‍යාව
vi. සංඛ්‍යානය
vii. පරිසණක විද්‍යාව
viii. ජෛව විවිධත්වය
ix. පාරිසරික විද්‍යාව
x. ආහාර තාක්ෂණය
xi. භූ විද්‍යාව
xii. ජාන විද්‍යාව
xiii. ශාඛ විද්‍යාව
xiv. කෘෂිකර්ම විද්‍යාව
xv. ශෂ්‍ය විද්‍යාව
xvi. පැළැටි අභිජනනය
xvii. පළිබෝධනාශක රසායන විද්‍යාව
xviii. විෂ විද්‍යාව.

සටහන - 1. විවෘත බඳවා ගැනීම් සඳහා ඉදිරිපත් වන අයදුම්කරුවන් විභාගයට ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනයට හෝ ඊට පෙර මූලික අධ්‍යාපන සුදුසුකම් ලෙසට නියම කර ඇති උපාධිය හෝ පශ්චාත් උපාධි සම්බන්ධයෙන් වූ පූර්ණ සුදුසුකම් ලබාගෙන තිබිය යුතුය. මේ සඳහා උපාධි සහතිකයේ / පශ්චාත් උපාධි සහතිකයේ වලංගු දිනය, ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනය හෝ ඊට පෙර දිනයක් විය යුතුය.

සටහන -2 ; ප්‍රතිඵල අපේක්ෂාවෙන් ඉදිරිපත් කරන ඉල්ලුම් පත්‍ර වලංගු නොවේ.

07. *සීමිත තරඟ විභාගය..*-කෘෂිකර්ම නිලධාරි තනතුරේ පවත්නා පුරප්පාඩු සංඛ්‍යාවෙන් 66 2/3%, පර්යේෂණ නිලධාරි තනතුරේ පවත්නා පුරප්පාඩු සංඛ්‍යාවෙන් 40% ක් සහ කෘෂි ආර්ථික විද්‍යාඥ තනතුරේ පවත්නා පුරප්පාඩු සංඛ්‍යාවෙන් 20% ක්ද, විභාගයට පෙනී සිටින අවස්ථාවේදී අයදුම්කරුවන් දරන ලද තනතුරු සඳහා වෙන් කරනු ලබන පහත වගුවේ දැක්වෙන ප්‍රතිශතයනට සහ පහත 07.2 හි විධිවිධානවලට අනුකූලව පුරවනු ලැබේ. කෙසේ වුවද එකී ප්‍රතිශතයනට සරිලන සංඛ්‍යාවක් සීමිත බඳවා ගැනීම් යටතේ පත් කර ගැනීමට නොහැකි අවස්ථාවලදී ඉතිරි පුරප්පාඩු සංඛ්‍යාව විවෘත බඳවා ගැනීම් වලින් පුරවනු ලැබේ.

උප ලේඛනගත තනතුර	චරිතමාන තනතුර		
	කෘෂිකර්ම උපදේශක සහ උද්‍යාන සහකාර	පර්යේෂණ සහකාර, කෘෂිවිද්‍යා පරීක්ෂණ නිලධාරී පාංශු සමීක්ෂක හා ඉඩම් ඇගයීමේ නිලධාරි	ආර්ථික විද්‍යාඥ සහකාර
කෘෂිකර්ම නිලධාරි	66 2/3%	-	-
පර්යේෂණ නිලධාරි	-	40%	-
කෘෂි ආර්ථික විද්‍යාඥ	-	-	20%

07.1 *සුදුසුකම් ලබන නිලධාරීන්*-අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර 05 ක සතුටුදායක සේවා කාලයක් සපුරා තිබෙන ;

(අ) ශ්‍රී ලංකා තාක්ෂණ සේවාවේ විශේෂ පංතියේ කෘෂිකර්ම උපදේශක, පර්යේෂණ සහකාර, පාංශු සමීක්ෂක හා ඉඩම් ඇගයීමේ නිලධාරි තනතුරු දරන නිලධාරීහු ;

(ආ) ශ්‍රී ලංකා තාක්ෂණ සේවාවේ පළමුවැනි පංතියේ අවම වශයෙන් වසර 04 ක සතුටුදායක සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කර තිබෙන කෘෂිකර්ම උපදේශක, පර්යේෂණ සහකාර පාංශු සමීක්ෂක හා ඉඩම් ඇගයීමේ නිලධාරි තනතුරු දරන නිලධාරීහු ;

(ඇ) වසර 05 ක සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කර ඇති කෘෂි විද්‍යා පරීක්ෂණ නිලධාරීහු ;

(ඈ) වසර 08 ක සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කර ඇති ආර්ථික විද්‍යාඥ සහකාර තනතුරු දරන නිලධාරීහු ; සහ

(ඉ) වසර 10 ක සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කර ඇති උද්‍යාන සහකාර තනතුර දරන නිලධාරීහු;

ඉහත 07 හි දක්වා ඇති පරිදි කෘෂිකර්ම නිලධාරි, පර්යේෂණ නිලධාරි සහ කෘෂි ආර්ථික විද්‍යාඥ තනතුරු සඳහා තරඟ විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ලබති.

සටහන 1 - අයදුම්පත් භාරගන්නා දිනට පසුව ඉල්ලුම්කරුවෙකු සම්බන්ධයෙන් අතීතයට බල පැවැත්වෙන පරිදි ක්‍රියාත්මක කරනු ලබන සහන හෝ උසස්වීම් විභාගයට පෙනී සිටීම සඳහා නියමිත සුදුසුකම් සපුරාලීමක් ලෙස සලකා බලනු නොලැබේ.

සටහන 2 - ඉල්ලුම්පත් භාර ගන්නා අවසන් දිනය වන විට වැඩ තහනම් කර සිටින නිලධාරියෙකු විභාගයට අයදුම් කිරීම සඳහා සුදුස්සකු නොවේ.

07.2 *බඳවා ගැනීමේ ක්‍රමය :*

(අ) ඉහත 07 ඡේදයේ සඳහන් එක් එක් තනතුරු සඳහා මෙම නිවේදනයේ 13 වෙනි ඡේදයේ නියම කර ඇති පොදු ප්‍රශ්න පත්‍රයට සහ අදාළ වන පරිදි විෂයානුබද්ධ විෂයයට නියමිත ප්‍රශ්න පත්‍රයකටද අයදුම්කරුවන් පිළිතුරු සැපයිය යුතුය.

(ආ) නියමිත සෑම ප්‍රශ්න පත්‍රයක් සඳහාම 50% හෝ ඊට වැඩි ලකුණු සංඛ්‍යාවක් ලබා ගන්නා අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණයකට කැඳවනු ලැබේ.

(ඇ) පොදු තරඟ විභාගයේදී නියමිත ප්‍රශ්න පත්‍රවලට ලබා ගන්නා සම්පූර්ණ ලකුණු සංඛ්‍යාවේ සහ ජ්‍යෙෂ්ඨතාවය වෙනුවෙන් ප්‍රදානය කරනු ලබන ලකුණු සංඛ්‍යාවෙහි එකතුවෙහි උපරිම අනුපිළිවෙල මත 07 ඡේදයේ විධිවිධාන වලට අනුකූලව බඳවා ගැනීම් සිදුකරනු ලැබේ.

සටහන 1 - සීමිත තරඟ විභාගය සඳහා පෙනී සිට සම්මුඛ පරීක්ෂණයට කැඳවූ අයදුම්කරුවන් සඳහා පමණක් ජ්‍යෙෂ්ඨත්වය සඳහා ලකුණු ලබාදෙනු ලැබේ.

සටහන 2 - ජ්‍යෙෂ්ඨතාවය සඳහා ලකුණුදීමේ ක්‍රමය - අයදුම්කරුවෙකු නියමිත සුදුසුකම් සපුරාලන ලද දින සිට අයදුම්පත් භාර ගන්නා අවසාන දින දක්වා සේවය කල සක්‍රීය කාලසීමාව පමණක් ජ්‍යෙෂ්ඨතාවයට ලකුණුදීම සඳහා ගණන් ගනු ලැබේ. එම සක්‍රීය සේවා කාලයට ගැනෙන එක් වසරකට ලකුණු 01 ක් බැගින් ද, දින 180ක් හෝ ඊට වැඩි සේවා කාලයක් වෙනුවෙන් ලකුණු 1/2 බැගින් ද ප්‍රදානය කරනු ලැබේ.

සටහන 3 - මධ්‍යම මට්ටමේ කාර්මික සේවාවේ II පංතියේ "අ " ඛණ්ඩයේ වසර 04 ක සක්‍රීය සතුටුදායක සේවා කාලයකින් පසුව සම්පූර්ණ කර ඇති සක්‍රීය සතුටුදායක සේවා කාලයක් වෙනුවෙන්ද ජ්‍යෙෂ්ඨතාවය සඳහාවූ ලකුණු ප්‍රදානය කිරීම සිදු කෙරේ.

08. *විභාගය පවත්වන ස්ථානය හා දිනය.-* මෙම විභාගය කොළඹ දී පමණක් විභාග කොමසාරිස් ජනරාල් විසින් 2004 ඔක්තෝබර් මස පවත්වනු ලැබේ.

09. *විභාග ගාස්තු.*-විභාග ගාස්තු රු. 250කි. පේරාදෙණිය තැපැල් කාර්යාලය මගින් මාරු කිරීමට හැකිවන අයුරු "කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්" නමින් ලියූ මුදල් ඇණවුමක් මේ සඳහා අයදුම්පත් සමග ගැලවීමට හැකිවන ලෙස අමුණා එවිය යුතුය. මොනම හේතුවක් නිසාවත් විභාග ගාස්තු ආපසු ගෙවනු නොලැබේ.

10. *විභාගයට පෙනී සිටීම :-*

(අ) ඉල්ලුම්පත් ලැබී ඇති සියළුම පුද්ගලයින්ට, විභාග කොමසාරිස් ජනරාල් විසින් ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. විභාගයට පෙනී සිටින අපේක්ෂකයෙකු විභාග මධ්‍යස්ථානයේ ශාලාධිපතිට තම ප්‍රවේශ පත්‍ර ඉදිරිපත් කළ යුතුය. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරණ අපේක්ෂකයෙකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

(ආ) අපේක්ෂකයෙකු තමාට නියම කර ඇති විභාග ශාලාවේ දී තමාට හිමි විභාගයට පෙනී සිටිය යුතුය. සෑම අපේක්ෂකයෙකුම නියමිත විභාග ශාලාවට අදාල ප්‍රවේශ පත්‍රය පළමුවෙන්ම එම ශාලාවේ දී පෙනී සිටින දින එහි ශාලාධිපතිට භාර දිය යුතුය. තමාට පෙනී සිටීමට හිමි විභාගයේ නියමිත ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම සෑම අපේක්ෂකයෙකුගේම වගකීමකි. සෑම අපේක්ෂකයෙකුම අනුගමනය කළ යුතු නීති මාලාවක් මෙම *ගැසට් පත්‍රයේ* පළ කර ඇත.

(ඇ) අපේක්ෂකයෙකුට ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු/ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකමක් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

11. *අපේක්ෂකයාගේ අනන්‍යතාවය*-තමා පෙනී සිටින සෑම විෂයයක් සම්බන්ධයෙන් පරිපාලක සෑහීමකට පත් වන අයුරින් අපේක්ෂකයෙකු විභාග ශාලාවේ දී තම අනන්‍යතාවය ඔප්පු කර සිටිය යුතුය. මේ සඳහා පහත සඳහන් ලේඛණ පමණක් පිළිගනු ලැබේ.

(අ) පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත්කර ඇති හැඳුනුම්පත

(ආ) වලංගු විදේශ ගමන් බලපත්‍රය

12. *විභාග ක්‍රමය.-*

(i) විභාග මාධ්‍යය

(අ) විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය වලින් පවත්වනු ලැබේ.

(ආ) අපේක්ෂකයෙකු විභාගයට පෙනී සිටිය යුතු වන්නේ තමා සුදුසුකම් ලත් විභාගයට පෙනී සිටි භාෂාවෙන් හෝ රාජ්‍ය භාෂාවෙන් ය.

(ඇ) අපේක්ෂකයෙකු සුදුසුකම්ලත් විභාගයේ විෂයයන් භාෂා දෙකකින් හෝ වැඩි ගණනකින් හෝ සමත්ව ඇත්නම්, එම විභාගයේ දී ඔහු සමත් වූ විෂයයන්ගෙන් වැඩි ගණනකට යොදාගත් භාෂාවෙන් හෝ රාජ්‍ය භාෂාවෙන් හෝ විභාගයට පෙනී සිටිය යුතුය.

සටහන-ඉහත (i) (ආ) සහ (ඇ) හි ඇති "සුදුසුකම්ලත් විභාගය" යන පදයෙන් අදහස් කරන්නේ 6.2 වැනි ඡේදයෙහි දක්වා ඇති විභාගවලින් එකක් ය.

(ii) අපේක්ෂකයෙකු විභාගයේ දී පෙනී සිටින සියළුම ප්‍රශ්න පත්‍රවලට එකම භාෂාවකින් පමණක් පිළිතුරු ලිවිය යුතුය.

(iii) තම ඉල්ලුම් පත්‍රයෙහි සඳහන් කර ඇති මාධ්‍ය පසුව වෙනස් කිරීමට අපේක්ෂකයන්ට ඉඩ දෙනු නොලැබේ.

13. *තරඟ විභාග පරිපාටිය හා අදාල විෂය නිර්දේශය.*-ඉහත 05 ඡේදයේ දක්වා ඇති පරිදි, සියළුම අයදුම්කරුවන් මෙහි මතු දැක්වෙන විෂය නිර්දේශයනට අනුකූලව 1 වන සහ 2 වන ප්‍රශ්න පත්‍ර සඳහා පිළිතුරු සැපයිය යුතුය.

(i) 1 වන ප්‍රශ්න පත්‍රය : පොදු ප්‍රශ්න පත්‍රය

භාෂාමය, ගණිතමය හා තර්කන හැකියාව මැන බැලීම සඳහා ප්‍රශ්න ඇතුලත් බහුවරණ ප්‍රශ්න පත්‍රයකි. කාලය පැය 1 1/4කි. මුළු ලකුණු සංඛ්‍යාව 150කි. මෙම ප්‍රශ්න පත්‍රයට සියළුම අපේක්ෂකයින් පෙනී සිටීම අනිවාර්යය වේ.

(ii) 2 වන ප්‍රශ්න පත්‍රය : විෂයානුබද්ධ දැනුම මැන බැලීම

මෙහි නියම කර ඇති විෂයය ක්ෂේත්‍රය පිළිබඳ දැනුම මැන බැලීම සඳහා පවත්වනු ලබන ලිඛිත අභියෝගාත්මක පරීක්ෂණයකි. එක් එක් අයදුම්කරුවෙකු විසින් තමන්

ඉල්ලුම් කරනු ලබන තනතුරට හෝ තනතුරුවලට අදාලවන පරිදි පළමුවන උපලේඛනයේ සඳහන් ප්‍රශ්න පත්‍ර අතුරින් තෝරාගනු ලබන ප්‍රශ්න පත්‍ර එකකට හෝ දෙකකට පෙනී සිටිය යුතුය. මෙම ප්‍රශ්න පත්‍රය කෙටි ප්‍රශ්න 25කින් යුක්ත වේ. කාලය පැය 2ක් වන අතර, මුළු ලකුණු සංඛ්‍යාව 150ක් වේ.

එක් එක් තනතුරට අදාල විෂයය නිර්දේශයෙන් පළමුවන උපලේඛනයේ දැක්වේ.

14. *සම්මුඛ පරීක්ෂණය*- සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත් කිරීම රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සිදු කරනු ලැබේ. එහි සභාපති වශයෙන් කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් කටයුතු කරන අතර, කෘෂිකර්මය හා රාජ්‍ය පරිපාලන විෂය භාර අමාත්‍යාංශවල ලේකම්වරුන්ගේ නියෝජිතයෙකු බැගින් සහ අදාල වන පරිදි, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකු අනෙකුත් සාමාජිකයින් වශයෙන් කටයුතු කරනු ඇත.

(i) ඉහත 06(ඇ) හා 07.2 (ආ) උපඡේදවල විධිවිධානවලට අනුකූලව විවෘත හා සීමිත අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට භාජනය කෙරේ. එහිදී අයදුම්කරුවන්ගේ මූලික සුදුසුකම් සනාථ කිරීම සඳහා වූ ලියවිලි සහ සහතික පත් පරීක්ෂා කරනු ලැබේ.

(ii) අයදුම්කරුවෙකු විවෘත තරඟ විභාගය සඳහා උපලේඛනගත තනතුරු දෙකකට ඉල්ලුම් කොට, එකී තනතුරු දෙකටම තෝරා ගනු ලැබීම සඳහා ප්‍රමාණවත් ලකුණු සංඛ්‍යාවක් ලබාගෙන ඇති විටක අපේක්ෂකයාගේ මනාපය හා පුරප්පාඩු සංඛ්‍යාව ද සැලකිල්ලට ගෙන අවස්ථාවෝචිතව බඳවා ගැනීම සිදුකරනු ඇත.

15. ඉල්ලුම් පත්‍රයට සහතික කිසිවක් අමුණා නොඑවිය යුතුය. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට භාජනය කරන අවස්ථාවේ දී පමණක් ඔවුන් තම අයදුම් පත්‍රයෙහි සඳහන් කර ඇති සුදුසුකම් සනාථ කිරීම සඳහා සහතිකවල මුල් ලේඛණ ඉදිරිපත් කිරීමට සූදානමින් සිටිය යුතුය.

16. *සාවද්‍ය තොරතුරු සැපයීම*- අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත්, විභාගයට කලින් හෝ විභාගය පවත්වන කාලයේ දී හෝ වි භාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී, ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. අපේක්ෂකයෙකු ඉදිරිපත් කර ඇති කිසියම් කරුණක් සාවද්‍ය බව හෝ යම් වැදගත් කරුණක් ඕනෑකමින්ම යටපත් කර ඇති බව හෝ, පත්වීම් දීමෙන් පසුව හෙළි වුවහොත් ඔහු රජයේ සේවයෙන් පහ කිරීමට හේතුවනු ඇත.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,
තිස්ස වර්ණසූරිය,
ලේකම්,
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා
වාරිමාර්ග අමාත්‍යාංශය.

80/5, "ගොවිජන මන්දිරය",
රජමල්වත්ත පටුමග,
බත්තරමුල්ල.

ආදර්ශ අයදුම් පත්‍රය

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ II වැනි පංතියේ II වැනි ශ්‍රේණියේ තනතුරු සඳහා විවෘත හා සීමිත තරඟ විභාග අයදුම් පත්‍රය - 2004

විභාග අංකය [ ]

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි.)

ඉල්ලුම් කරන විභාගය

සීමිත තරඟ විභාගය	
විවෘත තරඟ විභාගය	
සීමිත හා විවෘත	

(*සැලකිය යුතුයි* : අදාල කොටුවේ ලකුණ යොදන්න)

විභාගය සඳහා ඉල්ලුම්කරන තනතුර/තනතුරු හා දෙවන ප්‍රශ්න පත්‍රය සඳහා තෝරා ගනු ලබන ප්‍රශ්න පත්‍ර (විවෘත අපේක්ෂකයින් තමන් විසින් තෝරාගනු ලබන තනතුර/ තනතුරු සඳහා අදාල වන පරිදි 13 ඡේදයේ සඳහන් විෂය නිර්දේශය අනුව ප්‍රශ්න පත්‍ර තෝරා ගත යුතුය)

බඳවා ගැනීමේ ක්‍රමය සීමිතද/විවෘතද යන්න	විභාගය සඳහා ඉල්ලුම් කරන තනතුර/තනතුරු	තනතුරු අංකය (02 ඡේදය පරිදි)
1 2 3		

01. (i) මුලකුරු සමග අගට යෙදෙන නම :————————
(අ) සිංහලෙන්/දෙමළෙන් :————————
(ආ) ඉංග්‍රීසියෙන් :————————
(ii) මුලකුරුවලින් හැඳින්වෙන නම් :————
(අ) සිංහලෙන්/දෙමළෙන් :————————
(ආ) ඉංග්‍රීසියෙන් :————————
(iii) උපන්දිනය: වර්ෂය :————, මාසය :——, දිනය :——
(iv) ඉල්ලුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස
අවු:————, මාස:————, දින:————,
(v) ජාතික හැඳුනුම්පත් අංකය [ ]

02. (i) ස්ථිර පදිංචි ලිපිනය
(අ) සිංහලෙන්/දෙමළෙන් :————————
(ආ) ඉංග්‍රීසියෙන් :————————
(ii) රාජකාරි ලිපිනය:(රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරියෙකු නම් ඔහුගේ රාජකාරි ලිපිනය ලිවිය යුතුය. ලිපිනයෙහි වෙනසක් වුණි නම් එය වහාම දැන්විය යුතුය)
(අ) සිංහලෙන්/දෙමළෙන් :————————
(ආ) ඉංග්‍රීසියෙන් :————————

03. ස්ත්‍රී /පුරුෂ භාවය(ඉදිරි කොටුවෙහි නියමිත අක්ෂරය යොදන්න)
පුරුෂ - M
ස්ත්‍රී - F [ ]

04. විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍ය (ඉදිරි කොටුවෙහි නියමිත අක්ෂරය යොදන්න)
සිංහල - S
දෙමළ - T [ ]
ඉංග්‍රීසි - E

05. ශ්‍රී ලංකාවේ පුරවැසියෙක්ද යන වග (ඉදිරි කොටුවෙහි නියමිත වචනය යොදන්න)
ඔව්/නැත [ ]

06. අධ්‍යාපන සුදුසුකම්: (විවෘත අපේක්ෂකයින් සඳහා)

ලබා ඇති උපාධිය/ උපාධි	අධ්‍යයන වර්ෂය හා එම උපාධිය වලංගු වන දිනය (පැහැදිලිව දක්වන්න)	විශ්ව විද්‍යාලය	විෂයයන්	සාමාර්ථය	භාෂා මාධ්‍ය
1. සිව් අවුරුදු කෘෂි විද්‍යා මාධ්‍යය 2. තුන් අවුරුදු කෘෂි විද්‍යා 3. සිව් අවුරුදු විද්‍යා 4. තුන් අවුරුදු විද්‍යා 5. දැවුරුදු පශ්චාත් උපාධිය (නිබන්ධනයක් සහිත)					

07. මීට පෙර ශ්‍රී ලං.කෘ.සේ. බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගවලට පෙනී සිටියේ ද යන්න ?

පෙනී සිටියේ නම් පෙනී සිටි වර්ෂයන් සඳහන් කරන්න.

08. සීමිත තරඟ විභාග අපේක්ෂකයින් සඳහා සුදුසුකම් හා තෝරා ගනු ලබන ප්‍රශ්න පත්‍රය *ගැසට් නිවේදනයේ* 07 වැනි ඡේදය යටතේ මෙම විභාගයට පෙනී සිටීමට සුදුස්සෙකු වීම පිණිස ලබා ඇති සුදුසුකම් මෙහි පහත දක්වන්න.

වර්තමාන තනතුර	සීමිත බඳවා ගැනීම් යටතේ බඳවා ගැනීමට සුදුසුකම් ලබන තනතුර	කෘෂි නිලධාරි, පර්යේෂණ නිලධාරි, කෘෂිආර්ථික විද්‍යාඥයන්ට ඉල්ලුම් කිරීමට සුදුසුකම් සම්පූර්ණ කරන දිනය (*ගැසට් නිවේදනයේ* 07.1 හි දක්වා ඇතිසුදුසුකම් සම්පූර්ණ කරන දිනය
1. කෘ.වි.පරි.නිලධාරි 2. පර්.සහකාර 3. පස් සමි.නිලධාරි 4. ඉඩම්ඇග.නිලධාරි 5. කෘෂි උපදේශක 6. උද්‍යානසහකාර 7. ආර්.විද්‍යාඥසහකාර	1. පර්යේෂණනිලධාරි 2. කෘෂිකර්මනිලධාරි 3. ආර්ථිකවිද්‍යාඥසහකාර	

09. උසාවියක් ඉදිරියේ ඔබ කිසියම් චෝදනාවකට වරදකරුව ඇද්ද? ඔව්/නැත. ඔව් නම් විස්තර සපයන්න.

10. විභාග ගාස්තු වශයෙන් කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් නමින් ලියූ රු. 250ක් වටිනා මුදල් ඇණවුමක් ගැලවීමට හැකි අයුරු එක් කොනකින් ඇමිණිය යුතුය. (එහි අංකය, තැපැල් කාර්යාලය හා දිනය මෙහි සඳහන් කරන්න)

මුදල් ඇණවුම් අංකය	ලබා ගත් තැපැල් කාර්යාලය	දිනය

11. අයදුම්කරුගේ ප්‍රකාශය :

මෙම ඉල්ලුම්පත්‍රයෙහි මවිසින් සපයන ලද තොරතුරු සත්‍යවූත්, නිවැරදි වූත් ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුලත් තොරතුරුවලින් කිසිවක් අසත්‍ය හෝ වැරදි හෝ බව මා තෝරා ගැනීමට පෙර දැනගතහොත් මාගේ අයදුම්පත ප්‍රතික්ෂේප වීමට යටත් බවත්, තෝරාගැනීමෙන් පසුව ඒ බව දැනගතහොත් මාගේ පත්වීම වහාම අවලංගු වන බවත්, අයදුම්පත සම්පූර්ණ කිරීමේදී යම් ප්‍රමාදයක් සිදුව ඇත්නම් එහි වගකීම මා වෙත පැවරෙන බවත්, මම හොඳාකාරවම දැන සිටිමි.

————————————————
අයදුම්කරුගේ අත්සන.

දිනය :————————.

(අයදුම්කරු රජයේ දෙපාර්තමේන්තුවක සේවය කරන්නේ නම්, පහත සඳහන් සහතිකය සමග සිය දෙපාර්තමේන්තු හෝ සංස්ථා ප්‍රධානියාගේ මාර්ගයෙන් අයදුම්පත ඉදිරිපත් කළ යුතුය)

අයදුම්කරුගේ අත්සන සහතික කිරීම

මෙම අයදුම්පත ඉදිරිපත් කරනුලබන————————— මහතා/මහත්මිය/ මෙනෙවිය මා පෞද්ගලිකව දන්නා බවත්, ඔහු/ඇය මා ඉදිරියේ දී දින ———— ———— ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවත් සහතික කරමි. ———————————————— මහතා/මහත්මිය/මෙනෙවිය මෙම දෙපාර්තමේන්තුවේ/සංස්ථාවේ සේවයේ නියුතු බවත්, ඔහුගේ /ඇයගේ වැඩ හා හැසිරීම සතුටුදායක බවත් විනය ක්‍රියා මාර්ගයක් ඇති/නැති බවත් සහතික කරමි. ඔහු/ඇය තෝරා ගනු ලැබුවහොත් මුදා හළ හැකිය/නොහැකිය.

————————————————
අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන

දිනය :————————-

අත්සන සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :————————-

තනතුර:————————-

ලිපිනය :————————-

(අයදුම්කරු සීමිත තරඟ විභාගයට පෙනී සිටින්නෙක් නම් පහත දැක්වෙන අයුරු තම අයදුම්පත සහතික කර ඉදිරිපත් කළ යුතුය)

දෙපාර්තමේන්තු අධ්‍යක්ෂකගේ/පළාත් සභා ලේකම්ගේ සහතිකය

————————————— මහතා/මහත්මිය/මෙනෙවිය මෙම දෙපාර්තමේන්තුවේ/පළාත් සභාවේ ————————— කු ලෙස සේවයේ නියුතු බවද, ඔහුගේ/ඇයගේ වැඩ හා හැසිරීම සතුටුදායක බවද, මෙම තනතුරට අදාළ 07.1 ඡේදයේ සුදුසුකම් සියල්ලක් සපුරා ඇති බැවින් ඔහු/ඇය මෙම තනතුරට අයදුම් කිරීමට සෑම අතින්ම සුදුසුකම් සපුරන බවද, විනයානුකූල ක්‍රියා මාර්ගයක් ඇති/නැති බවත් සහතික කරමි.

————————————————
අධ්‍යක්ෂ/පළාත් සභා ලේකම්ගේ
අත්සන හා නිලමුද්‍රාව

නම :————————-

තනතුර :————————-

ලිපිනය :————————-

දිනය :————————-

එක් එක් තනතුරට අදාල විෂය නිර්දේශයන් පහත දැක්වේ.

1 *පර්යේෂණ නිලධාරි තනතුර සඳහා ප්‍රශ්න පත්‍රය* :

අයදුම්කරුවන්ගේ මනාපය පරිදි පහත (අ) සහ (ආ) හි සඳහන් කොටස් 02 අතරින් එක් කොටසක් සඳහා පමණක් පිළිතුරු සැපයිය යුතුය.

(අ) කොටස

01. කෘෂිකාර්මික උද්භිද විද්‍යාව :
බෝගවල වර්ගීකරණ මූලධර්ම,බෝග වර්ධන හා කායික විද්‍යාත්මක මූලධර්ම

02. ප්‍රවේනි විද්‍යාව හා ශාඛා අභිජනනය :
මෙන්ඩල්ගේ නියම, ගහණ, ප්‍රවේනි විද්‍යාව, විකෘති, අනුක ප්‍රවේනිය, සෛල ප්‍රවේනි විද්‍යාව, ප්‍රමාණාත්මක ප්‍රවේනි විද්‍යාව, ශාක අභිජනනයේ මූල ධර්ම, ජාන සම්පත් ආරක්ෂා කිරීම හා ජෛව විවිධත්වය, පරාගත සහ අභිජනන සංකල්ප, විසංයෝගීතාව, මහා සහ නුමුහුන් ජේලි වර්ණය බහුලව භාවිතා වන අභිජනන ක්‍රම හා වර්තමාන නැඹුරුව

03. ශාක ව්‍යාධි විද්‍යාව :
ව්‍යාධිජනක ජීවී කාණ්ඩ, ආසාදන ඒවාට පැලෑටි දක්වන සංවේදීතාවය, ආසාදන ආකාරය, මේවා පාලනයේ මූලධර්ම, ශාඛ ව්‍යාධි විද්‍යාවේ සහ රෝග පාලනය පිළිබඳව වර්තමාන නැඹුරුව, රෝග විනිශ්චය කිරීමේ තාක්ෂණ ක්‍රම, රෝග ලක්ෂණ විද්‍යාව, කොක්ගේ උපකල්පිතය, රෝග වි නිශ්චයේ නව තාක්ෂණ ක්‍රම (ELISA) හා වර්තමාන නැඹුරුව

04. කීට විද්‍යාවේ මූලධර්ම :
සත්ව වර්ගීකරණයේ මූලධර්ම, කෘමීන් වර්ග විලාසයන්, ජීවන තොරතුරු සහ හානි, කෘමි හානි වල ආර්ථික වැදගත් කම, කෘමි ගහණ හා හානි තක්සේරු කිරීම

05. බීජ තාක්ෂණය :
බීජ කායික විද්‍යාව, ව්‍යුහ, සුප්තතාවය, ප්‍රරෝහනය, ජීව්‍යතාවය, බීජ පරීක්ෂණය සහ පාරිශුද්ධතාවය සඳහා පරීක්ෂණ, බීජ නිෂ්පාදනයේ අවස්ථා, බීජ සහතික කිරීම, බීජ ගබඩා කිරීම

06. පටක විද්‍යාව :
මූලධර්ම, පටක විද්‍යාව පහසුකම් හා අවශ්‍යතාවය, මාධ්‍යයන්, පටක වි ද්‍යා රෝපන ක්‍රම, භාවිතා කරන අවස්ථා, ප්‍රාක්ප්ලාස්මීය රෝපනය, වි කෘති බිහිවීම, කළල බේරා ගැනීම, නලස්ථ සංසේචනය, ජානමය පරිනාමය, ප්‍රාක් සංරක්ෂණය; හෝ

(ආ) කොටස

01. ශෂ්‍ය විද්‍යාව :
කෘෂි දේශගුණික විද්‍යාව, පරිසර විද්‍යාව, භූමි සංචර්ධනය, භූමි සැකසීම, බෝග වර්ධනයේ හා කායික විද්‍යාවේ මූලධර්ම, භෝග වර්ධන මිනුම්, අස්වනු පරාමිති, පොහොර නිර්දේශ හා කාර්යක්ෂමතාවය, වල් පැලෑටිවල ජීව විද්‍යාව හා පාලනය, ජල සම්පාදක ක්‍රම වල මූලධර්ම, භෝග පාංශු හා ජල සම්බන්ධතාවයේ මූලධර්ම

02. භෝග විද්‍යාව :
වී, උස්බිම් ධාන්‍ය, මාෂ භෝග, අල බෝග හා අනිකුත් ක්ෂේත්‍ර භෝගවල කායික විද්‍යාව, වර්ධනය, ප්‍රචාරණ ක්‍රම, රෝපන ක්‍රම, භෝග පාලනයේ භෞතික, රසායනික හා ජීව විද්‍යාත්මක ක්‍රම, විද්‍යාත්මක තෘණ බිම් ඇති කිරීම හා ඒවා පාලනය, දැව නිෂ්පාදනය හා පළතුරු නිෂ්පාදන මූලධර්ම

03. පාංශු විද්‍යාව :
පස, නිර්මානය, පසක භෞතික හා රසායනික ගති ලක්ෂණ, බෝග වගාවට අදාලව පසෙහි ඇති ගැටළු, පසෙහි සාරවත් බව පාලනය, ජල පෝෂක පාලනය, පැලෑටි පෝෂණය, පාංශු වර්ගීකරණ මූලධර්ම

04. ප්‍රවේනි විද්‍යාව හා පැලෑටි අභිජනනය :
මූල ධර්ම, මෙන්ඩල්ගේ නියම, ගහණ ප්‍රවේනි විද්‍යාව, විකෘති, අනුක ප්‍රවේනි විද්‍යාව, සෛල ප්‍රවේනි විද්‍යාව, ශාක අභිජනනයේ මූලධර්ම, ජාන සම්පත් ආරක්ෂා කිරීම හා ජෛව විවිධත්වය

05. පැලෑටි ව්‍යාධි විද්‍යාව :
පැලෑටි ආසාධනය, ආසාධන වලට පැලෑටිවල සංවේදිතාවය, ජෛව පාලනය, රෝග පාලනයේ නූතන ප්‍රවනතා,

06. කීට විද්‍යා මූලධර්ම :
(අ) ප්‍රශ්න පත්‍රයේ 04 උපඡේදය යටතේ දක්වා ඇත.

07. ක්ෂේත්‍ර පර්යේෂණ මූලධර්ම හා සංඛ්‍යාන මූලධර්මයන් (Statistical Principles) සහ ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ වැදගත් සංඛ්‍යා ලේඛණ පිළිබඳ දැනුම.

08. කීට විද්‍යාව :
කෘෂිකර්මයේ දී ආර්ථික වශයෙන් වැදගත් කෘමීන්, ඔවුන්ගේ වර්ගීකරණය, බාහිර හා අභ්‍යන්තර ගති ලක්ෂණ, විවිධ පද්ධති වල නිර්මාණය හා ඒවායින් කෙරෙන කාර්යයන්, පලිබෝධ පාලනය, පළිබෝධ හානි වල වැදගත් කම, පළිබෝධකයින් හඳුනා ගැනීම, ඔවුන්ගේ හානිය හා මර්ධනය , ඒකාබද්ධ පළිබෝධ පාලනය

09. ක්ෂුද්‍ර ජෛව විද්‍යාව :
ක්ෂුද්‍ර ජීවීන් හා කෘෂිකාර්මික පරිසරය, ජෛව තාක්ෂණය, කෘෂිකර්මය සඳහා භාවිතය, පාංශු ජීවීන් හා කෘෂිකර්මයට ඔවුන්ගේ බලපෑම

10. ජීවමිතිය හා ව්‍යවහාරික යෙදවුම් සංඛ්‍යායනය :
සංඛ්‍යායනය සම්බන්ධ මූලික දැනුම, කෘෂිකාර්මික පර්යේෂණ, සැලසුම් වි ශ්ලේෂණ, දත්තයන් ලබා ගැනීම හා ඒවා විශ්ලේෂනය කිරීම.

සටහන. - විවෘත සහ සීමිත බඳවා ගැනීම් තුළින් පර්යේෂණ නිලධාරි තනතුරුවලට අයදුම්කරනු ලබන සියළුම අපේක්ෂකයින් ඉහත (අ) හෝ (ආ) හි සඳහන් කොටස් 02 අතරින් කවර හෝ එක් කොටසකට පමණක් පිළිතුරු සැපයීම අනිවාර්ය වේ.

II. කෘෂිකර්ම නිලධාරි කථිකාචාර්ය තනතුරු සඳහා ප්‍රශ්න පත්‍රය

01. සාමාන්‍ය කෘෂිකර්මය
ශ්‍රී ලංකාවේ දේශගුණික කලාප, ඉඩම් සංචර්ධනය , භූමි සැකසීම හා ආම්පන්න, භෝග ස්ථාපනය හා ඒ සඳහා අවශ්‍ය කරන යන්ත්‍ර සූත්‍ර, පස සහ පසෙහි සාරවත් බව, තවාන් හා තවාන් පාලන, රෝපන ද්‍රව්‍ය, පළිබෝධ හා පළිබෝධ මර්ධනය, පැලෑටි සංරක්ෂණ උපකරණ, භෝග වගා ක්‍රම, ජල සම්පාදන ක්‍රම, ඒකාබද්ධ ගොවිතැන්, ආරක්ෂිත කෘෂිකර්මය, ක්ෂුද්‍ර ජල සම්පාදන ක්‍රම, අස්වැන්න නෙලීම හා අස්වැන්න නෙලන උපකරණ, පසු අස්වනු හානි, ගොවිපල් නිෂ්පාදන සකස් කිරීම, විශේෂිත ප්‍රදේශවල වගා කිරීමට සුදුසු එළවළු වර්ග, පළතුරු, පියලි භෝග සහ ධාන්‍ය තෝරා ගැනීමේදී සැලකිය යුතු කරුණු ඒකාබද්ධ පළිබෝධ පාලනය, ඒකාබද්ධ පැලෑටි පෝෂණ පද්ධති, ශාක ආරක්ෂණ පනත, පශු සංරක්ෂණ පනත.

02. භෝග නිෂ්පාදනය
ශෂ්‍ය විද්‍යාව, කෘෂි දේශගුණය සහ පරිසරය, භූමි සංචර්ධනය සහ බිම් සැකසීම භෝගවල වැඩීමේ මූලධර්ම සහ පැලෑටි භෞතවේදය, භෝගවල වැඩීම මැනීම, අස්වනු සංරචක , පොහොර නිර්දේශ හා ඒවායේ කාර්යක්ෂමතාවය, වල් පැලෑටි වල ජීව විද්‍යාව සහ මර්ධනය, ජල සම්පාදනය, ශෂ්‍ය විද්‍යාව, භෝග හා ජලය අතර සම්බන්ධතාවයේ මූලධර්ම

03. ක්ෂේත්‍ර භෝග
හැඳින්වීම, පාරිසරික අවශ්‍යතාවයන්, ශාක විශේෂ හා ප්‍රභේද , පැලෑටි වර්ධනයේ භෞතවේදය, අස්වැන්න තීරණය කිරීමේ කායික විද්‍යාත්මක මූලධර්ම, වී භෝගයේ ශෂ්‍ය විද්‍යාව, භෝග පාලනය හා නිෂ්පාදනය , උස්බිම්, ධාන්‍ය, රනිල, අලභෝග සහ වෙනත් වැදගත් ක්ෂේත්‍ර භෝග (දුම්කොල, ලූණු, කෙඳි භෝග සහ තෙල් භෝග)

04. භෝග පාලනය
අතුරු භෝග වගාව, අස්වැන්න නෙලීම හා සැකසීම

05. උද්‍යාන භෝග නිෂ්පාදනය
පළතුරු නිෂ්පාදනය, පෝෂණ අගය, සාමාජික හා ආර්ථික සාධක, ආරම්භය හා ව්‍යාප්තිය, පාරිසරික අවශ්‍යතාවයන් , වගා ක්‍රම, නව තාක්ෂණික ක්‍රම භාවිතය.

06. පළතුරු, එළවළු හා මල් නිෂ්පාදනය
තවාන් පාලනය, උද්‍යාන පාලනය, භෝග ආශ්‍රිතව නව තාක්ෂණයන් හා වගා ක්‍රම, පළතුරු හා එළවළු භෝග වැඩිදියුණු කිරීම, පළතුරු හා එළවළු මූලික වූ භෝග වගා ක්‍රම, පසු අස්වනු හානි, පළතුරු හා එළවළුවලට පසු අස්වනු ජෛව තාක්ෂණය, පළතුරු හා එළවළු වලට දේශීය හා විදේශීය වෙළඳ පොලවල් නූතන සීමාවන් හා අනාගත උපාය මාර්ග, එළවළු නිෂ්පාදනය සඳහා අවශ්‍යතාවයන්, එළවළු මූලික වූ භෝග වගා ක්‍රම, අලෙවිය, මල් වගා කර්මාන්තය, ප්‍රචාරන තාක්ෂණය වගා ක්‍රම, ප්‍රශස්ත පරාමිති, භූමි අලංකාරණය මූලධර්ම.

III. කෘෂි ආර්ථික විද්‍යාඥ තනතුර සඳහා ප්‍රශ්න පත්‍රය

01. කෘෂිකාර්මික නිෂ්පාදන ආර්ථික විද්‍යාව හා ගොවිපල් පාලනය
කෘෂිකාර්මික නිෂ්පාදනයේ දී ගොවිපල් පාලනයේ ඇති වැදගත් කම, මූලික සංකල්ප, නිෂ්පාදන ශ්‍රීතය, නිෂ්පාදන ශ්‍රීතයන්හි ස්වරූප, නිෂ්පාදන ශ්‍රීතයේ හැඩය, නිෂ්පාදන උපේක්ෂා වක්‍ර Plor ත්වර්ණය, සම ආදායම් රේඛාව, උපයන සම්පත් සම්බන්ධතාවය හා පිරිවැය අවම ප්‍රමාණයට අවධානය පිළිබඳ මූලධර්ම, හීනවන ඵලදා න්‍යාය, ආදේශය හා ආදායම් ප්‍රතිවිපාක, කෘෂිකර්මයේ ඇති අවධානම හා අඩමානය, අඩමානයට මුහුණ දීම සඳහා නිෂ්පාදනය සකස් කිරීමේ නැමියාව, හා විවිධාංගනය, කෘෂිකාර්මික මිළ නියම කිරීමට අදාළ වන පරිදි මිළනාය්‍යය, බෝග සහ සත්ව සංයෝග අගය කිරීම, ගොවිපල් ප්‍රමාණය හා පරිමාණකූල ඵල, පවුල් ගොවිපල්වල වැදගත් කම හා සාපේක්ෂ වාසිය පිළිබඳ මූලධර්ම,ගොවි පල් සංවිධානයේ ශක්තිමත් හා දුර්වල කරුණු නිර්ණය කිරීමේදී සටහන්වල ඇති වැදගත් කම හා උපරිම කරන ආකෘති සඳහා මෙම තොරතුරු ඇතුළත් කිරීම.

02. කෘෂිකාර්මික අලෙවිය
අලෙවි කිරීමේ සාමාන්‍ය මූලධර්ම , නිෂ්පාදනයේ හා අලෙවියේ සාපේක්ෂ වැදගත්කම, ශ්‍රී ලංකාවේ අලෙවිය පිළිබඳ කටයුතු කරන ආයතන, අලෙවි මාර්ග වර්ධනය කෙරෙහි බලපෑමක් ඇති කිරීමෙහි ලා එවැනි ආයතනයක කාර්යභාරය ශ්‍රීලංකාවේ කෘෂිකාර්මික නිෂ්පාදන අලෙවි කිරීමේදී මුහුණ පෑමට සිදුවන ගැටළු හා අලෙවි කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීමට අදාල මූලධර්ම.

03. ඉඩම් ආර්ථික විද්‍යාව
ආර්ථික විද්‍යාමය සංකල්ප ඉඩම් පරිශීලනයට බලපාන අයුරු ශ්‍රී ලංකාවේ ඉඩම් සඳහා ඉල්ලුම හා සැපයුම, ඉඩම් පරිශීලන කටයුතු ශ්‍රී ලංකාවේ සැලසුම් කරන අයුරු, ශ්‍රී ලංකාවේ ගොවි ජනපද පිහිටුවීමේ හා මිනිසුන් පදිංචි කරවීමේ වැඩ සටහනේ වැදගත්කම.

ජන සංනිවේදන අමාත්‍යාංශය

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය

ශ්‍රී ලංකාවේ මුද්‍රණ හා ග්‍රැෆික් ක්ෂේත්‍රයන්ට අදාල පාඨමාලා හඳුන්වාදීමේ අද්විතීය ස්ථානයක් ලබා සිටින ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය එම ක්ෂේත්‍රයට අදාල දැනුම, හැකියා, දක්ෂතා සහ විශේෂඥතා ඥානය ප්‍රවර්ධනය කිරීම සඳහා මුළුමනින්ම කැපවී කටයුතු කරයි.

වර්ෂ 1984 දී පාර්ලිමේන්තු ආඥා පනතක් මගින් ස්ථාපනය කරන ලද මෙම ආයතනය මුද්‍රණ සහ ග්‍රැෆික් ක්ෂේත්‍රයට අදාල පහත සඳහන් පාඨමාලා ජූලි/අගෝස්තු මාසවලදී ආරම්භ කිරීමට කටයුතු යොදා ඇත.

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය මගින් පවත්වනු ලබන පහත සඳහන් පාඨමාලාවන්ට ඉතා ඉහළ ඉල්ලුමක් පවතින අතර මෙම පාඨමාලාවන් මුද්‍රණ හා ග්‍රැෆික් ක්ෂේත්‍රයේ පවතින ඉහළ රැකියා ඉල්ලුමට සරිලන පාඨමාලා අන්තර්ගතයකින් සකසා ඇත.

(1) **පරිඝණක ආශ්‍රිත අකුරු ඇමිණීම සහ පරිඝණක ආශ්‍රිත මුද්‍රණය**
(Certificate Course in Computer Typesetting & Desk Top Publishing)
ග්‍රැෆික්, ප්‍රචාරක, මුද්‍රණ සහ ප්‍රකාශන ක්ෂේත්‍රයන්ට ඇතුළත්වීමට බලාපොරොත්තු වන නවකයන් සඳහා විශේෂයෙන් සැකසුණු පාඨමාලාවකි. පරිඝණක ආධාරයෙන් අකුරු ඇමිණීම පිළිබඳව පුළුල් අවබෝධයක් මින් ලබාදෙන අතර පරිඝණක දැනුමත් මුල සිටම පරිඝණක භාවිතය සහ මෘදුකාංග අධ්‍යයනය (Computers and Software applications) පිළිබඳව මනා දැනුමක් හා සිත්තම් නිර්මාණය පිළිබඳ මූලික අවබෝධයක් ද ලබාදෙන අතර, මෙම පාඨමාලාව ග්‍රැෆික්ස් පාඨමාලාව, හැදෑරීමට අවශ්‍ය පූර්ණ දැනුම (Cetificate course in Graphic Designing) හා අවබෝධය ලබාදෙයි.

පාඨමාලා කාලය	–	පැය 168 යි (මාස 5)
මාධ්‍යය	–	සිංහල/ඉංග්‍රීසි
ගාස්තු	–	රු. 7,000 යි.
දින	–	සතිපතා සහ සති අන්ත පන්ති කීපයක් පැවැත්වේ.

පාඨමාලා අන්තර්ගතය **(Course Content)** -
* Introduction to Computers
* Keyboard training & Fonts
* Word Processing using MS Word
* Page Make-up methods using Adobe Pagemaker
* Introduction to scanning and Image Manipulation
* Introdution to Vector Graphic Applications
* Page make-up methods using QuarkXpress
* Introduction Internet

(2) **පරිඝණක ආශ්‍රිත රූ රටා නිර්මාණකරණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව**
(Certificate Course in Computer Graphic Designing)
පරිඝණක ආශ්‍රිත නිර්මාණකරණයට උනන්දුවක් දක්වන නවකයන්ටත් ග්‍රැෆික්, ප්‍රචාරක, මුද්‍රණ සහ ප්‍රකාශන ක්ෂේත්‍රවල නියැලි පුද්ගලයන්ට මෙම පාඨමාලාව හඳුන්වා දෙයි.

පාඨමාලා කාලය	–	පැය 96 යි (මාස 4)
මාධ්‍යය	–	සිංහල/ඉංග්‍රීසි
ගාස්තු	–	රු. 9,000 යි.
පැය සහ වේලාවන්	–	සතිපතා සහ සති අන්ත පන්ති කීපයක් පැවැත්වේ.

පාඨමාලා අන්තර්ගතය **(Course Content)** -
* Light & Colour - Colour Theory & Colour Mangement.
* Pantone Traditional CMYK & Hexachrome Colour Management Systems
* Introduction to Computers
* How to Use Page Maker or Quark Xpress as Pagemake up Applications
* How to use CorelDraw or Macromedia Free Hand for Logo Desinging & Other Graphic Suits as a Vector Graphic Application
* Creating Vector Graphics using Adobe Illustrator
* How to us Adobe Photoshop as a Raster Graphic Image manipulation application
* Introduction to Adobe-Indesign
* Web Designing Concepts

මෙම පාඨමාලාවන්ට ඇතුල්වීමට ඇති ඉඩකඩ සීමාසහිත නිසා සම්මුඛ පරීක්ෂණයකින් අනතුරුව තෝරාගනු ලබන අපේක්ෂකයන්ට පමණක් පාඨමාලාව හැදෑරීමට අවස්ථාව ලැබේ. පාඨමාලා සාර්ථකව නිම කරන සිසුන්ට රජය පිළිගත් සහතිකයක් පිරිනැමේ.

විමසීම් : ලේඛකාධිකාරී,

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය
අංක 118, දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 08.
ටෙලිෆෝන් - **2686162 / 2679791**
ෆැක්ස් - **2686162**
ඊ මේල් - sliopreg@sri.lanka.net

06-67

මොරටුව විශ්වවිද්‍යාලය තාක්ෂණික ආයතනය

ජාතික තාක්ෂණ විද්‍යා ඩිප්ලෝමා පාඨමාලාව සඳහා සිසුන් ඇතුළත්කර ගැනීම –2004/2005

මොරටුව විශ්ව විද්‍යාලයට අයත් තාක්ෂණික ආයතනය මගින් පවත්වනු ලබන තුන් අවුරුදු පූර්ණ කාලීන ජාතික තාක්ෂණ විද්‍යා ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීම පිණිස සුදුසුකම් ලත් අපේක්ෂකයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම පාඨමාලාව, මොරටුව විශ්වවිද්‍යාලයීය තාක්ෂණ විද්‍යා ආයතනය නව පරිශ්‍රයක ස්ථාපනය කරන තෙක් මොරටුව විශ්වවිද්‍යාලයීය පරිශ්‍රය තුළ පැවැත්වෙනු ඇත.

1. සාමාන්‍ය :

ජාතික තාක්ෂණ විද්‍යා ඩිප්ලෝමා පාඨමාලාව දෑවුරුදු අධ්‍යයන හා එක් අවුරුදු ප්‍රායෝගික යන්ත්‍රාගාර පුහුණුවකින් ද සමන්විත වේ. පාඨමාලාව ඉංග්‍රීසි මාධ්‍යයෙන් පමණක් පැවැත්වේ.

මෙම පාඨමාලාවේ දී පහත සඳහන් විෂය ක්ෂේත්‍රයන් හැදෑරීමට අවස්ථාව ලැබේ.
(i) රසායන ඉංජිනේරු තාක්ෂණය
(ii) සිවිල් ඉංජිනේරු තාක්ෂණය
(iii) විදුලි ඉංජිනේරු තාක්ෂණය
(iv) ඉලෙක්ට්‍රොනික් හා විදුලි සංදේශ ඉංජිනේරු තාක්ෂණය
(v) නාවුක ඉංජිනේරු තාක්ෂණය
(vi) යාන්ත්‍රික ඉංජිනේරු තාක්ෂණය
(vii) නෞකා චාලන අධ්‍යයන හා තාක්ෂණය
(viii) පෙළිමර් තාක්ෂණය
(ix) පේෂකර්ම හා ඇහලුම් තාක්ෂණය

2. යෝග්‍යතාවය. :

2.1 වයස :
(අ) අයදුම්පත් කැඳවනු ලබන අවසන් දිනට අයදුම්කරුගේ වයස අවුරුදු 24 නොඉක්ම විය යුතුය.
(ආ) නෞකා චාලන අධ්‍යයන පාඨමාලාව හැදෑරීමට අපේක්ෂකයන් තෝරා ගැනීමේ දී වයස 20 ට අඩු අයදුම්කරුවන්ට ප්‍රමුඛත්වය දෙනු ලැබේ.

2.2 *අධ්‍යාපන සුදුසුකම්* :
(අ) අයදුම්කරුවන් ශ්‍රී ලංකා විභාග කොමසාරිස් ජනරාල් විසින් 2001 හෝ 2002 හෝ 2003 වසරේ පවත්වන ලද අ.පො.ස. (උ.පෙළ) විභාගයේ දී එක වර පහත සඳහන් විෂයයන්ගෙන් 03 ක් එත් සමත්විය යුතු ය.
(i) භෞතික විද්‍යාව
(ii) රසායන විද්‍යාව
(iii) සංයුක්ත ගණිතය
(iv) උසස් ගණිතය

3. *තෝරා ගැනීමේ පදනම / ක්‍රියාපරිපාටිය* :

3.1 *පාඨමාලාවට ඇතුළත් කර ගැනීම.* :

ශිෂ්‍යයන් තෝරා ගැනීම අ.පො.ස. (උ.පෙළ) විභාගයේ ප්‍රතිඵල හා මොරටුව විශ්ව විද්‍යාලයේ තාක්ෂණික ආයතනය මගින් පැවැත්වෙන යෝග්‍යතා පරීක්ෂණයේ සාමාර්ථය මත සිදුවේ.

යෝග්‍යතා පරීක්ෂණය සමත් වූ ශිෂ්‍යයන් අතරින් අ.පො.ස. (උ.පෙළ) විභාග ලකුණුවල කුසලතාවය මත සිසුන් තෝරා ගනු ලැබේ. (Z ලකුණු මත) 40% ක් අපො.ස. (උ.පෙළ) විභාගයේ කුසලතාවය මත හා 60% ක් දිස්ත්‍රික් පදනම මත ශිෂ්‍යයන් තෝරා ගැනීම සිදුවේ.

3.2 අධ්‍යයන ක්ෂේත්‍රය :

යෝග්‍යතා පරීක්ෂණයේ ලකුණු හා අයදුම්කරුගේ එක් එක් ක්ෂේත්‍රය සඳහා දක්වන කැමැත්තේ අනුපිළිවෙල, අධ්‍යයන ක්ෂේත්‍රය තෝරා ගැනීමේදී සැළකිල්ලට භාජනය කරනු ලැබේ.

4. *අයදුම් කිරීමේ පිළිවෙල* :

4.1 *අයදුම්පත් පෝරම* :
(I) *ගැසට් නිවේදනයේ* දක්වා ඇති ආදර්ශ අයදුම්පතට අනුකූලව ඉංග්‍රීසි භාෂාවෙන් පිළියෙල කරන ලද අයදුම්පතක් පහත දැක්වෙන ලියකියවිලිවල සහතික කළ පිටපත් සමඟ ඉදිරිපත් කළ යුතුය.
* අ.පො.ස. (උ.පෙළ) සහතිකය,
* අ.පො.ස. (උ.පෙළ) Z ලකුණු සඳහන් සහතිකය
* පාසැල් හැරයෑමේ සහතිකය
* උප්පැන්න සහතිකය
* ජාතික හැඳුණුම්පත

(ii) ලියුම් කවරයේ ඉහළ වම්පස කෙළවරේ "ජාතික තාක්ෂණ විද්‍යා ඩිප්ලෝමා ඇතුළත් වීම – 2004/2005" යනුවෙන් සඳහන් කර ලියාපදිංචි තැපෑලෙන් පහත සඳහන් ලිපිනයට එවිය යුතුය. අධ්‍යක්ෂ, මොරටුව විශ්වවිද්‍යාලයීය තාක්ෂණික ආයතනය, මොරටුව විශ්ව විද්‍යාලය, කටුබැද්ද, මොරටුව.

(iii) අයදුම්පත් භාර ගන්නා අවසන් දින හෝ ඊට පෙර ලැබෙන සේ අයදුම්පත සහ අදාල ලියවිලි එවිය යුතුය.
ආදර්ශ අයදුම්පත පහත සඳහන් අන්තර්ජාල වෙබ් අඩවියෙන් ලබා ගත හැක.
http://www.mrt.ac.lk/itum/

(iv) නාවික අධ්‍යයන ක්ෂේත්‍රයන් (SET 1) හෝ අනිකුත් ක්ෂේත්‍රයන් (SET 2) හෝ ක්ෂේත්‍රයන් දෙකම සඳහා ඉල්ලුම් කළ හැක. ක්ෂේත්‍රයන් දෙකම සඳහා අයදුම්කරන්නේ නම් ප්‍රමුඛතාවය සඳහන් කළ යුතුය.

4.2 *ඉල්ලුම්පත්‍ර ගාස්තු* :

ඉල්ලුම් පත්‍ර ගාස්තු වශයෙන් එක් ක්ෂේත්‍රයක් සඳහා රු. 150.00 (එකසිය පණහක්) හෝ ක්ෂේත්‍රයන් දෙකටම රු. 300.00 (තුන්සීයක්) ගෙවිය යුතු අතර, එම ගෙවීම ලංකා බැංකුවේ ඕනෑම ශාඛාවකින් "මොරටුව විශ්ව විද්‍යාලයීය තාක්ෂණික ආයතනය - ලංකා බැංකුවේ කටුබැද්ද ශාඛාවේ ගිණුම් අංක 300801412" දරන ගිණුමට ගෙවිය යුතුය. මෙම අයදුම්පත් ගාස්තු ආපසු ගෙවනු නොලැබේ.

4.3 *අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය* : 2004 ජූනි 30 වේ.

5. *යෝග්‍යතා පරීක්ෂණය* :

අ.පො.ස. (උ.පෙළ) විභාගයේ ප්‍රතිඵල මත එක් එක් දිස්ත්‍රික්කයට අදාල ලඝු කළ සිසුන් ප්‍රමාණය, මොරටුව විශ්වවිද්‍යාලයේ තාක්ෂණික ආයතනය මගින් පවත්වනු ලබන යෝග්‍යතා පරීක්ෂණයට කැඳවනු ලැබේ.

6. පාඨමාලාව සඳහා ලියාපදිංචි කිරීම :
(i) යම් පාඨමාලාවක් සඳහා තෝරා ගන්නා ලද අපේක්ෂකයන්, පාඨමාලාව සඳහා ලියාපදිංචි කරනු ලබන දින, පහත සඳහන් සහතිකවල මුල් පිටපත් ඉදිරිපත් කළ යුතු ය.
* අ.පො.ස. (උ.පෙළ) සහතිකය,
* අ.පො.ස. (උ.පෙළ) Z ලකුණු සඳහන් සහතිකය
* පාසැල් හැරයෑමේ සහතිකය
* උප්පැන්න සහතිකය

(ii) යම් පූර්ණ කාලීන පාඨමාලාවක් සඳහා වෙනත් විශ්වවිද්‍යාලයක (ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය හැර) හෝ අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ඇති උසස් අධ්‍යාපන ආයතනයක දැනටමත් ලියාපදිංචි වී ඇති සිසුන් මෙම පාඨමාලාව සඳහා ඉල්ලුම් කිරීමට හෝ ලියාපදිංචිවීමට සුදුසුකම් නොලබයි.

(iii) ජාතික තාක්ෂණ විද්‍යා ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීම සඳහා ලියාපදිංචි වන කිසිම අපේක්ෂකයෙකු, එම පාඨමාලාවේ කාලසීමාව තුළ දී, මෙම විශ්ව විද්‍යාලයේ වෙනත් පාඨමාලාවක් හෝ ශ්‍රී ලංකාවේ පිහිටා ඇති අන් කිසිම විශ්වවිද්‍යාලයක පාඨමාලාවක් හෝ අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ඇති වෙනත් උසස් අධ්‍යාපන ආයතනයක පාඨමාලාවක් හැදෑරීමට සුදුසුකම් නොලබයි.

අධ්‍යක්ෂ,
මොරටුව විශ්ව විද්‍යාලයීය තාක්ෂණික ආයතනය,
මොරටුව විශ්වවිද්‍යාලය,
කටුබැද්ද,
මොරටුව

2004 මැයි මස 21 වැනි දින දී ය.

අයදුම්පත්‍රය පිරවීම සඳහා උපදෙස්

1. *ගැසට් නිවේදනයේ* සඳහන් සෑම සුදුසුකමක්ම සපුරාලන අපේක්ෂකයින් පමණක් අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.

2. "ඒ4" ප්‍රමාණයේ සුදු කඩදාසිවල ආදර්ශ ආකෘති පත්‍රයට අනුකූලව අයදුම්පත සකස් කර අදාල කොටු පිරවීම කළ යුතුය. කඩදාසිවල තනි පැත්තක් පමණක් පාවිච්චි කරන්න. සෑම අයදුම්පතක්ම ඉංග්‍රීසියෙන් පමණක් සම්පූර්ණ කළ යුතුවේ.

පරිඝණක යන්ත්‍ර මාර්ගයෙන් අයදුම්පත් විශ්ලේෂණය කෙරෙන බැවින් අයදුම්පත ආකෘතියට අනුව පිළියෙල කළ යුතු අතර, ඔබේ අයදුම්පතෙහි SET 1 හා SET 2. යන කොටු පැහැදිලිව සම්පූර්ණ කිරීම ඉතාම වැදගත් වනු ඇත.

3. ඉල්ලුම් පත්‍රය සමඟ පහත සඳහන් සහතිකවල, පිටපත් ඇමිණිය යුතුය.
(i) අ.පො.ස. (උ.පෙළ) සහතිකය,)
(ii) අ.පො.ස. (උ.පෙළ) Z ලකුණු සඳහන් සහතිකය
(iii) පාසැල් හැරයෑමේ සහතිකය
(iv) උප්පැන්න සහතිකය
(v) ජාතික හැඳුණුම්පත

මෙම පිටපත් අවසන් වරට ඉගෙනගත් පාසැලේ විදුහල්පති විසින් හෝ සාමදාන විනිශ්චයකාරවරයෙකු තම නිල මුද්‍රාව යොදා සහතික කර තිබිය යුතු අතර, ඉල්ලා ඇති සියළුම සහතික පිටපත් නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

4. අයදුම්පත් ගාස්තුව ගෙවා ලංකා බැංකුවේ ශාඛාවකින් ලබා ගන්නා ලද රිසිට් පත ද, තම ලිපිනය ලියන ලද 9"× 4½" ප්‍රමාණයේ ලියුම් කවර දෙකක් ද ඇතුළත් කරන්න.

06-194

නිපුණතා සංවර්ධන වෘත්තිය හා කාර්මික අධ්‍යාපන අමාත්‍යාංශය

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය

(කුරුණෑගල දිස්ත්‍රික්කය) ආධුනිකයින් බඳවා ගැනීම 2004 ජූලි (අර්ධ වාර්ෂික)

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ පහත දැක්වෙන පූර්ණ කාලීන හා සති අන්ත පාඨමාලා සඳහා ශ්‍රී ලාංකීය පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. තෝරාගනු ලබන අයදුම්කරුවන් සඳහා න්‍යායික හා ප්‍රායෝගික පුහුණුවක් ලබාදෙන අතර පාඨමාලාව අවසානයේ පැවැත්වෙන වෘත්තීය පරීක්ෂණයෙන් සමත් වන අයට වෘත්තීය සහතික පත්‍රයක් පිරිනමනු ඇත.

1. පූර්ණ කාලීන පාඨමාලා

	පාඨමාලාවේ නම	සංකේත අංකය	කාලය
1.	පරිඝණක වැඩසටහන් ක්‍රියාකරු	COM	මාස 06
*2.	අධිවේගී මහන යන්ත්‍ර කාර්මික	ISMM	මාස 06
3.	ඇළුම්නියම් පිරිසැකසුම්	AL	මාස 06
4.	ආහාර සැකසීම හා පිළිගැන්වීම	CAT	මාස 06
*5.	ලී කැටයම් ශිල්පී	WC	මාස 06
*6.	උද්‍යාන අලංකරණය	L S	මාස 06
7.	ඇඳුම් මැසීම (කාන්තා හා ළමා)	DM	මාස 06
*8.	විදුලි කාර්මික (ගෘහස්ත)	DE	මාස 06
*9.	යතුරුපැදි කාර්මික	MCM	මාස 06
*10.	පැස්සුම් ශිල්පී	WE	මාස 06
*11.	වඩු කාර්මික	CP	මාස 06
*12.	ජලනල කාර්මික	PL	මාස 06
13.	ඇඟළුම් තත්වපාලක	Q.C	මාස 04
14.	අධිවේගී මහන යන්ත්‍ර ක්‍රියාකරු	ISMO	මාස 11/2

2. පාඨමාලා පිළිබඳ විස්තර

පාඨමාලා සංකේතය	අධ්‍යාපන සුදුසුකම්	පාඨමාලා ගාස්තුව
COM	ගණිතය ඉංග්‍රීසි විෂයන්ට සම්මාන සහිතව අ.පො.ස. සා. පෙළ සමත්වීම	1500
DE	අ.පො.ස. සා.පෙළට පෙනී සිටීම	නොමිලේ
CAT	අ.පො.ස. සා.පෙළට පෙනී සිටීම	නොමිලේ
AL	අ.පො.ස සා.පෙළට පෙනී සිටීම	750
Q.C	අ.පො.ස. සා.පෙළ විෂයයන් 06කින් සමත් වීම	3,600
ISMO	09 වසර සමත්වීම	නොමිලේ
LS	එම	නොමිලේ
WC	එම	නොමිලේ
ISMM	එම	නොමිලේ
DM	එම	500
MCM	එම	නොමිලේ
WE	9 වසර සමත්වීම	නොමිලේ
CP	එම	නොමිලේ
PL	එම	නොමිලේ

2.1 සියළුම පාඨමාලා සඳහා ඇතුල්වීමේ ගාස්තුව වශයෙන් රු. 200.00 ක මුදලක් අයකරනු ඇත.

2.2 * යොදා ඇති පාඨමාලා සඳහා මාසිකව රු. 450.00ක ආධුනික දීමනාවක් ගෙවනු ලැබේ.

3. පාඨමාලා පැවැත්වෙන ස්ථාන

පාඨමාලා සංකේතය	වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය
COM,ISMM,AL, LS,CAT, WC,DM	දිස්ත්‍රික් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය, සාරගම
DM,COM	ග්‍රාමීය වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය,Y.M.B.A. කුරුණෑගල
DE,DM,MCM, WE,ISMO	ග්‍රාමීය වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය, මාවතගම
DE,DM,CP	ග්‍රාමීය වෘත්තිය පුහුණු මධ්‍යස්ථානය, දාගම
WE,ISMO	ග්‍රාමීය වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය, දොඩම්ගස්ලන්ද
CP,ISMO	ග්‍රාමීය වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය, නාරම්මල
ISMO	ග්‍රාමීය වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය, ගිරිඋල්ල
COM,ISMO	ග්‍රාමීය වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය,පොල්ගහවෙල
MCM,PL	ග්‍රාමීය වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය, උදාගම, මහව
COM,DE,QC,DM	ග්‍රාමීය වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය, බිංගිරිය

4. සති අන්ත පාඨමාලා (වයස් සීමාවක් නොමැත)

	පාඨමාලාව	කාලය	ගාස්තුව
1.	පරිඝණක වැඩසටහන් ක්‍රියාකරු	මාස 06	5,500
2.	ඇඟළුම් තත්ව පාලක	මාස 03	3,600
3.	ඇඟළුම් නිෂ්පාදන සුපරීක්ෂක	මාස 03	5,700
4.	ඇඟළුම් නිෂ්පාදන කළමණාකරණ	මාස06	7,000
5.	අධිවේගී මහන යන්ත්‍ර කාර්මික	මාස 03	2,500
6.	සැලසුම් ශිල්පය	මාස 06	3,500
7.	අධිවේගී මහන යන්ත්‍ර ක්‍රියාකරු	මාස 11/2	820
8.	වෘත්තීය ඉංග්‍රීසි	පැය 60	2,000

4.1 ඉහත සඳහන් සියලුම පාඨමාලා සාරගම දිස්ත්‍රික් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයේ පැවැත්වෙන අතර 1 සහ 2 යන පාඨමාලා බිංගිරිය වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයේ ද පැවැත්වේ.

4.2පුහුණු කාලය අවසානයේදී කර්මාන්තශාලා පුහුණුවකට යොමු වීමට අවස්ථාව සලසනු ලැබේ.

4.3වෘත්තීය සහතික පත්‍රයක් පිරිනැමේ.

4.4එම ක්ෂේත්‍රයේ රැකියා අවස්ථා සඳහා යොමු කෙරේ.

ජීව දත්ත තොරතුරු සමඟින් ඔබ විසින් සකස් කරන ලද අයදුම් පත් ඔබගේ ලිපිනය සඳහන් මුද්දර ගැසූ දිග (9x11) ලියුම් කවරයක් සමඟ 2004.06.20 දිනට හෝ ඊට පෙර පහත ලිපිනයට යොමු කළ යුතුය. පාඨමාලාව හැදෑරීමට කැමති මධ්‍යස්ථානයේ නම ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ සඳහන් කර එවීම අනිවාර්ය වේ.

සහකාර අධ්‍යක්ෂ,
ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය,
දිස්ත්‍රික් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය,
සාරගම,
කුරුණෑගල.

දුරකථන අංකය : 037-2237436.

06-76

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ, ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ, ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ, ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ, ශ්‍රී ලංකා පොලිස් සේවයේ සහ ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ නිලධාරීන් සඳහා වූ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සහ දෙවන භාෂාව පිළිබඳ පරීක්ෂණය - 2004

ඉහත සේවාවල නිලධාරීන් සඳහා වූ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ හා දෙවන භාෂාව පිළිබඳ පරීක්ෂණ 2004 ඔක්තෝබර් මස කොළඹ සහ යාපනයේ දී පැවැත්වේ

02. කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ දෙකටම එකවර ඉදිරිපත් වීමට හැකි වන පරිදි කාල සටහන් සකස් කරනු ලැබේ.

03. විෂය නිර්දේශය

සේවය	කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය	ගැසට් පත්‍රයේ අංකය හා දිනය	විෂය නිර්දේශයට අදාළ පරිශිෂ්ඨය
ශ්‍රී ලංකා පරිපාලන සේවය	I වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය	1988.06.07 509/07	"ඇ"
	II වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය	එම	"ඇ"
	දෙවන භාෂා පරීක්ෂණය	-	"ඉ"
ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය	I වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය	2001.07.27 1194/26	"ඇ"
	II වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය	එම	"ඇ"

කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ විෂයයන් සඳහා එක වාරයකදී හෝ වෙන් වෙන් වශයෙන් වාර කිහිපයකදී හෝ පෙනී සිටීමට නිලධාරීන්ට අවසර තිබේ. කෙසේ වුවත් නියම කර ඇතිකාලසීමාව තුළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් වීම අත්‍යවශ්‍ය වේ.

දෙවන භාෂාව විෂයයට පෙනී සිටින නිලධාරීන් සඳහා වූ වාචික පරීක්ෂණයන් එක මධ්‍යස්ථානයකදී පැවැත්වීමට කටයුතු කරනු ඇත.

04. (අ) එක් එක් සේවාවල කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සඳහා වන විෂයයන් පහත දැක්වේ.

ශ්‍රී ලංකා පරිපාලන සේවය

I වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය			II වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය		
විෂය අංකය	විෂය	කාල සීමාව පැය	විෂය අංකය	විෂය	කාල සීමාව පැය
01	දණ්ඩ නීති සංග්‍රහය හා සාක්ෂි ආඥාපනත	3	20	ආර්ථික හා සමාජ ප්‍රතිපත්ති (ශ්‍රී ලංකාව කෙරෙහි විශේෂ අවධානය සහිතව)	3

I වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය			II වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය		
විෂය අංකය	විෂය	කාල සීමාව පැය	විෂය අංකය	විෂය	කාල සීමාව පැය
02	ශ්‍රී ලංකාවේ නීති ක්‍රම සහ උසාවි සංවිධානය	3	21	සංචර්ධන පරිපාලනය පිළිබඳ ක්‍රියා පද්ධති (ශ්‍රී ලංකාව කෙරෙහි විශේෂ අවධානය සහිතව)	3
03	ශ්‍රී ලංකාවේ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා	3	22	කළමනාකරණය හා සංවිධානය	3
04	මූල්‍ය ක්‍රම	3			
05	පරිපාලනය	3			
06	ආර්ථික විද්‍යාව	3			
07	සමාජ විද්‍යාව	3			
08	ඉංග්‍රීසි	3			
	දෙවන භාෂාව පිළිබඳ පරීක්ෂණය			අවශ්‍ය නම් මෙහි සඳහන් අනෙකුත් සේවාවල නිලධාරීන්ට ද දෙවන භාෂා පරීක්ෂණය සඳහා ඉල්ලුම් කළ හැකිය.	
09	සිංහල (ලිඛිත)	2			
10	දෙමළ (ලිඛිත)	2			
11	ඉංග්‍රීසි(ලිඛිත)	2			
12	සිංහල (වාචික)				
13	දෙමළ(වාචික)				
14	ඉංග්‍රීසි (වාචික)				

ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය

I වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය			II වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය		
විෂය අංකය	විෂයය	කාල සීමාව	විෂය අංකය	විෂය	කාල සීමාව
30	රජයේ මූල්‍ය පටිපාටි	3	36	කළමනාකරණ ගණකාධිකරණය	3
31	නීතිය හා කළමනාකරණය	3	37	රාජ්‍ය මුදල් කළමනාකරණය	3
32	පරිපාලනය	3	38	කළමනාකරණය හා සංවිධානය	3
33	වාර්තා ලිවීම හා කළමනාකරණය වෙත තොරතුරු ඉදිරිපත් කිරීම	3		දෙවන භාෂා පරීක්ෂණය (මේ සඳහා ඉල්ලුම් කරන නිලධාරීන් විෂය හා විෂය අංක ශ්‍රී ලංකා පරිපාලන සේවය යටතේ බලන්න)	

ශ්‍රී ලංකා පොලිස් සේවය

විෂය අංකය	විෂය	කාල සීමාව පැය
80	යුක්තිය පසිඳලීමේ පනත සහ සාක්ෂි ආඥාපනත	3
81	දණ්ඩ නීති සංග්‍රහය සහ පොලිස් ආඥාපනත	3
	දෙවන භාෂා පරීක්ෂණය - මේ සඳහා ඉල්ලුම් කරන නිලධාරීන් විෂය හා විෂයය අංක, ශ්‍රී ලංකා පරිපාලන සේවය යටතේ බලන්න.	

ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය, ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය, ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවය

විෂය අංකය	විෂයය	කාල සීමාව පැය
04	මූල්‍ය ක්‍රම	3
05	පරිපාලනය	3

04. (ආ) විභාගයේ නම

ශ්‍රී ලංකා පරිපාලන සේවය	පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය	01
ශ්‍රී ලංකා පරිපාලන සේවය	දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය	02
දෙවැනි භාෂාව පිළිබඳ පරීක්ෂණය		03
ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය	පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය	01
ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය	දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය	02
ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය	පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය	01
ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවය	පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය	01
ශ්‍රී ලංකා පොලිස් සේවය	පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය	01
ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය	පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය	01

05. කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණවලින් සමත් වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කිරීම

ශ්‍රී ලංකා පරිපාලන සේවය	විෂයය	නිදහස් කරනු ලැබීමට අවශ්‍ය සුදුසුකම්
පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය	නීතිය	බැරිස්ටර්වරයෙකු, ශ්‍රේෂ්ඨාධිකරණයේ අධිනීතිඥවරයෙකු, නීතිඥවරයෙකු, විශ්ව විද්‍යාලයක නීතිය පිළිබඳ උපාධිධාරියෙකු වීම.
	ආර්ථික විද්‍යාව/සමාජ විද්‍යාව	ආර්ථික විද්‍යාව හෝ සමාජ විද්‍යාව පිළිබඳ විශේෂ උපාධිධාරියෙකු වීම.
	ඉංග්‍රීසි	ශ්‍රී ලංකා සංචර්ධන පරිපාලන ආයතනයේ ආධුනික නිලධාරි පුහුණු පාඨමාලාවේ ඉංග්‍රීසි විෂයය සමත්වීම.
දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය	කළමනාකරණය හා සංවිධානය	ශ්‍රී ලංකා සංචර්ධන පරිපාලන ආයතනයේ රාජ්‍ය පරිපාලනය පිළිබඳ සහතිකය.
දෙවන භාෂා පරීක්ෂණය	සිංහල/දෙමළ/ඉංග්‍රීසි	ප්‍රමාණතත්වයක පරීක්ෂණයකින් සමත්ව තිබීම.

ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය	විෂයය	නිදහස් කරනු ලැබීමට අවශ්‍ය සුදුසුකම්
දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය	36 කළමනාකරණ ගණකාධිකරණය 37 රාජ්‍ය මුදල් කළමනාකරණය 38 කළමනාකරණය හා සංවිධානය	ශ්‍රී ලංකා සංචර්ධන පරිපාලන ආයතනය මගින් මෙහෙයවනු ලබන රාජ්‍ය මුදල් කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාව හෝ ජාතික ව්‍යාපාර කළමනාකරණ ආයතනය මගින් මෙහෙයවනු ලබන පරිගණක පද්ධති සැළසුම් පිළිබඳ ඉහළ ඩිප්ලෝමාව හෝ ගණකාධිකරණය, වාණිජ්‍ය, කළමනාකරණය, රාජ්‍ය පරිපාලනය, ව්‍යාපාර පරිපාලනය, පරිගණක විද්‍යාව යන ක්ෂේත්‍රයන්ගේ ලැබූ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව/ශාස්ත්‍රපති/දර්ශනවේදී (පීඑච්-ඩී) උපාධිය හෝ වරලත් ගණකාධිකාරී ආයතනය, වරලත් කළමනාකරණය ගණකාධිකාරීන්ගේ ආයතනය, සහතික ලත් ගණකාධිකාරීන්ගේ වරලත් සංගමය, බ්‍රිතාන්‍ය පරිගණක සංගමය, ඕස්ට්‍රේලියානු පරිගණක සංගමය යන මේවායින් එකක අවසාන පරීක්ෂණය හෝ මණ්ඩලය විසින් පිළිගනු ලබන වෙනත් ඕනෑම සම මට්ටමේ සුදුසුකම්.

06. භාෂා විෂයයන්ට අදාළ ප්‍රශ්ණ පත්‍ර හැර අනෙකුත් සියළුම විෂයයන්ට සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි මාධ්‍යයෙන් පිළිතුරු සැපයීමට අපේක්ෂකයින්ට හැකිවනු සඳහා අවශ්‍ය විධිවිධාන විභාග කොමසාරිස් ජනරාල් විසින් සලසනු ඇත.

07. යම් අපේක්ෂකයෙකු තමාට හිමිකම් නොමැති මාධ්‍යයකින් විභාගයට පෙනී සිටි බැව් පසුව හෙළි වුවහොත් ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

08. ඉල්ලුම්පත්‍ර මෙහි සඳහන් ආකෘතියට අනුව ඒ 4 කොළයක සකස් කොට ඉදිරිපත් කළ යුතුය. ඒ 4 කොළයේ 1-5 දක්වා අංක මුල් පිටුවේ එන පරිදි විය යුතුය. ඉහත සඳහන් පරීක්ෂණ දෙකටම පෙනී සිටින්නේ නම් වෙන වෙනම එක් එක් විභාගයන් සඳහා අයදුම්පත් ඉදිරිපත් කළයුතුය.

09. ඉල්ලුම්පත්‍ර 2004 සැප්තැම්බර් 27 වැනි දින හෝ ඊට ප්‍රථම පහත සඳහන් ලිපිනයට ලැබෙන පරිදි දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. නියමිත දිනට පසුව ලැබෙන ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.විභාග කොමසාරිස් ජනරාල්,විභාග දෙපාර්තමේන්තුව, බත්තරමුල්ල, පැලවත්ත.

10. යම් අපේක්ෂකයෙකුට, තමාගේ විභාග ප්‍රවේශ පත්‍රය නොලැබුණහොත්, ඒ බව අප්‍රමාදව, විභාග කොමසාරිස් ජනරාල්ට පහත සඳහන් විස්තර සමඟ දැනුම් දිය යුතුය. (විදුලි පණිවුඩ යවන ලිපිනය "විභාග බත්තරමුල්ල" වේ.)

(i) විභාගයේ නම
(ii) අයදුම්කරුගේ සම්පූර්ණ නම
(iii) ලිපිනය
(iv) ඉල්ලුම්පත්‍රය තැපැල් කළ දිනය, ලියාපදිංචි අංකය, හා තැපැල් කාර්යාලය

11. ඉහත (10) වැනි ඡේදයේ සඳහන් විස්තර සැපයීමට අපොහොසත් වන අපේක්ෂකයින් විසින් පසුව ඉදිරිපත් කැරෙන ලියකියවිලි සලකා බලනු නොලැබේ.

12. හැඳුනුම්පත් ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කර ඇති 1971 ජූනි මස 29 වැනි දින අංක එස්ඊ 274 දරන චක්‍රලේඛය කෙරෙහි සියළුම අපේක්ෂකයන්ගේ අවධානය යොමු කරනු ලැබේ. විභාග ශාලාවේදී පහත සඳහන් හැඳුනුම්පත් මගින් තමන්ගේ අනන්‍යතාවය පිළිබඳ සාක්ෂි ඉදිරිපත් කිරීම අපේක්ෂකයන්ගේ වගකීම වනු ඇත.

(i) ජාතික හැඳුනුම්පත
(ii) වලංගු ගමන් බලපත්‍රය
(iii) පෝස්ට් මාස්ටර් ජනරාල් විසින් නිකුත් කරන ලද තැපැල් හැඳුනුම් පත
(iv) සහතික කරන ලද ඡායාරූපයක්

13. විභාග ගාස්තු පහත දැක්වේ.

(අ) පළමුවතාව (සම්පූර්ණ විභාගය හෝ කොටසක්) සඳහා ගාස්තු අය නොකෙරේ.

	රු.	ශත
(ආ) ඉන්පසු එක් එක් වතාව සඳහා		
සම්පූර්ණ විභාගය සඳහා	115	00
එක් විෂයයකට	75	00
වාචික පරීක්ෂණයට	75	00

අපේක්ෂකයින් විසින් අත්සන තබා නිසි පරිදි අවලංගු කිරීමෙන් ආදායම් මුද්දර මගින් ගාස්තු ගෙවිය යුතුය.

එස්. සී. මාන්නප්පෙරුම,
ලේකම්,
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.
2004 මැයි මස 18 වැනි දින,
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

ශ්‍රී ලංකා පරිපාලන සේවය
"ඇ" පරිශිෂ්ඨය

(අ) ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරීන් සඳහා වූ පළමු වැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය පහත දැක්වෙන විෂයයන්ගෙන් සමන්විත වේ.

(1) නීතිය
(2) මූල්‍ය ක්‍රම
(3) පරිපාලනය
(4) (අ) ආර්ථික විද්‍යාව හෝ (ආ) සමාජ විද්‍යාව
(5) ඉංග්‍රීසි

(1) නීතිය

විෂය නිර්දේශය : -

(අ) ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව - පහත සඳහන් පනත් සහ රාජඥා විෂයෙහි (සංශෝධනයන් ඇතුළුව) දැනුමක් අපේක්ෂකයින්ගෙන් බලාපොරොත්තු වේ. ලංකා (ආණ්ඩුක්‍රම හා ස්වාධීනතා) රාජාඥාව 1946 සහ 1947 (379 වැනි අධිකාරය) 1948 අංක 18 දරන පුරවැසි පනත (349 පරිච්ඡේදය) ලංකා පාර්ලිමේන්තු මැතිවරණ රාජාඥාව 1846 (381 වැනි අධිකාරය) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා.

(ආ) ශ්‍රී ලංකාවේ නීති ක්‍රම සහ උසාවි සංවිධානය, උසාවි ආඥාපනත (6 වැනි පරිච්ඡේදය) සහ 1971 අංක 44 දරන අභියාචනා උසාවි පනත පිළිබඳ මනා දැනුමක් අපේක්ෂකයින්ගෙන් බලාපොරොත්තු වේ.

(ඇ) දණ්ඩ නීති සංග්‍රහය සහ සාක්ෂි ආඥාපනත (19 වැනි සහ 14 වැනි පරිච්ඡේදය)

සටහන : නීතිය පිළිබඳ එක් එක් විෂයයකට අදාළ ලකුණු වලින් සියයට 33, 1/3 එක් එක් සාමාර්ථය සඳහා සියයට 40 ක සාමාන්‍ය ලකුණු ප්‍රමාණයක් ද අපේක්ෂකයින් විසින් ලබාගත යුතුය.

(2) මූල්‍ය ක්‍රම

විෂය නිර්දේශය : -

(අ) ශ්‍රී ලංකා ආණ්ඩුවේ මුදල් රෙගුලාසි 1 වැනි කාණ්ඩය (X වැනි පරිච්ඡේදය හැර)

(ආ) වෙවී යන වර්ෂයේ ඇස්තමේන්තු උදා : ඒවා සකස් කිරීම ශීර්ෂ මූල්‍ය ක්‍රම සහ විසර්ජන පනත්

සටහන සාමාර්ථය සඳහා මුළු ලකුණු වලින් සියයට 40 ක් අපේක්ෂකයෙකු විසින් ලබා ගත යුතුය.

(3) පරිපාලනය

විෂය නිර්දේශය : -

(අ) කාර්යාල සහ ක්ෂේත්‍ර සංවිධානය සහ ක්‍රම

(ආ) ආයතන සංග්‍රහයේ පරිච්ඡේද I, II, III, V, VI, VII, IX, XI, XXIII, XXV, XXVI, XXVII, XXVIII, XXIX, XXX, XXXI, XXXII, XXXIII, XLVII, XLVIII.

සටහන : සාමාර්ථය සඳහා මුළු ලකුණු වලින් සියයට 40 ක් අපේක්ෂකයෙකු විසින් ලබාගත යුතුය.

(4) (අ) ආර්ථික විද්‍යාව

විෂය නිර්දේශය : -

(අ) ඇගැයීම්, නිපැයුම් හා බෙදා හැරීම් පිළිබඳ න්‍යායයන් කෙරෙහි විශේෂ සැලකිල්ලකින් යුතුව ආර්ථික විද්‍යා මූලධර්ම

(ආ) මුදල්, බැංකු ක්‍රම, ජාත්‍යන්තර වෙළඳාමෙහි මූල්‍ය ක්‍රම
(ඇ) ශ්‍රී ලංකාවේ ආර්ථික ව්‍යුහය
සටහන : සාමාර්ථය සඳහා මුළු ලකුණු වලින් සියයට 40 ක් අපේක්ෂකයෙකු විසින් ලබා ගත යුතුය.

(4) (ආ) සමාජ විද්‍යාව

විෂය නිර්දේශය : -
(අ) සමාජ සැකැස්ම - සංවිධානය සහ ක්‍රියාකාරිත්වය
(ආ) මානව සබඳතා සහ කණ්ඩායම්වලට බෙදීම
(ඇ) බන්ධුත්වය, විවාහය සහ පවුල
(ඈ) ග්‍රාමීය සහ නාගරික සමාජය
(ඉ) සමාජ ස්ථරායනය සහ විභේදනය
(ඊ) සමාජ පාලනය
(උ) සංස්කෘතිය, ආගම සදාචාරය සහ ඇගයුම්
සටහන : - සාමාර්ථය සඳහා මුළු ලකුණු වලින් සියයට 40ක් අපේක්ෂකයෙකු විසින් ලබා ගත යුතුය.

(5) ඉංග්‍රීසි

විෂය නිර්දේශය : -
Contents

(a) *Grammar* : The following areas will be tested :
(1) The verb Forms all the principal tenses of English e. g. the Present Simple Tense, the simple Past, the Future the Present Perfect, etc.
(2) Nouns, Countable, Uncountable.
(3) Pronouns.
(4) Adjective Degrees of Comparison.
(5) Adverbs of Frequency, Work order phrases and sentences.
(6) Prepositions.
(7) Determiners.
(8) Question Words.
(9) Model auxiliaries, Can, Could, May, might,Should, Must, Ought to.
(10) The Definite Article.
(11) Cardinals/Ordinals.
(12) The Passive Construction.
(13) Relative Clauses.
(14) if Clauses.
(15) Reported Speech.
(16) There is/There are.
(17) Have/Has.

(b) *Vocabulary :* The vocabulary tested will be that of General Modern English with special emphasis on the following fields ; Management, Administration and Social and Economic Development.

(c) *Reading :* Ability to (i) Understand the sense of a passage and the writer's attitude to the subject (ii) Grasp the draft of an argument (iii) Draw implications from what is written.

(d) *Writing :* Ability to write Essays, Departmental Reports, Official Letters, Circulars, Minutes, Memos, fill in forms.

(e) *Speech :* Ability to speak fluently in the following situations :
(i) Social English e. g. – Greetings Introductions, Farewells, Requests, Conveying information.
(ii) Speaking over the telephone.
(iii) Interview skills, Questioning and Answering Orally.
(iv) Meetings, making speeches, proposing a Vote of Thanks .

(f) *Listening* : Listening to speeches, lectures, dialogues and conversations and the ability to understand and respond to what is said.

SCHEME OF EXAMINATION

1 Written Examination : There will be one paper of 3 hours duration.
2. Oral Examination : The Oral Examination will consist of 2 parts.
The candidate will be expected to perform these tasks :
(a) Carry on a conversation ;
(b) Describe a picture ;
(c) Read aloud from a passage ;
(d) Listen to and write down a passage of dictation of about 80 words.

Note : A candidate will be required to obtain minimum 40 percent of the total marks for a pass.

"ඇ" පරිශිෂ්ඨය

(අ) ශ්‍රී ලංකා පරිපාලන සේවය II වැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ විෂය නිර්දේශය
(1) ආර්ථික හා සමාජ ප්‍රතිපත්තිය (ශ්‍රී ලංකාව පිළිබඳ විශේෂ සැළකිල්ලක් සහිතව)
(2) සංචර්ධන පරිපාලනය පිළිබඳ ක්‍රියා පද්ධතිය (ශ්‍රී ලංකාව පිළිබඳ විශේෂ සැළකිල්ලක් සහිතව)
(3) කළමනාකරණය සහ සංවිධානය

විෂය නිර්දේශය :-
(1) ආර්ථික හා සමාජ ප්‍රතිපත්තිය (ශ්‍රී ලංකාව පිළිබඳ විශේෂ සැළකිල්ලක් සහිතව)
ශ්‍රී ලංකාවේ ආර්ථික සමාජ ප්‍රතිපත්ති සම්පාදනය කිරීමේදී බලපාන කරුණු ගැන විභාගපේක්ෂකයාගේ දැනීම පරීක්ෂා කිරීම පිණිස මෙහි විෂය පිළිබඳ ප්‍රශ්න සකස් කරනු ඇත. ව්‍යවහාරික ආර්ථික විද්‍යාව සහ ව්‍යවහාරික සමාජ විද්‍යාව පිළිබඳ මූලධර්ම ගැන මෙන්ම ශ්‍රී ලංකාවේ මෑත ආර්ථිකය සමාජ හා දේශපාලන ඉතිහාසය පිළිබඳ දැනීමක් විභාගාපේක්ෂකයාගෙන් අපේක්ෂා කෙරේ.
සටහන : සාමාර්ථයක් සඳහා සම්පූර්ණ ලකුණු සංඛ්‍යාවෙන් 40%ක් විභාගාපේක්ෂකයෙකු විසින් ලබා ගත යුතු වේ.
(2) (ශ්‍රී ලංකාව පිළිබඳ විශේෂ සැලකිල්ලක් සහිතව) සංචර්ධන පරිපාලනය පිළිබඳ ක්‍රියා පද්ධතිය.
පහත සඳහන් කරුණු ගැන විශේෂ සැලකිල්ලක් සහිතව සංචර්ධන පරිපාලනය පිළිබඳ ආයතන, ඒවායේ ක්‍රියාකාරිත්වය සහ ඒ ඒ ආයතන අතර පවත්නා සම්බන්ධතාවයන් ගැන අවබෝධයක් විභාගාපේක්ෂකයන්ගෙන් අපේක්ෂා කෙරේ.
(අ) ශ්‍රී ලංකාවේ රාජ්‍ය පාලන තන්ත්‍රය.
(ආ) ශ්‍රී ලංකාවේ රාජ්‍ය පාලන තන්ත්‍රයෙහි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාත්මක පසුබිම.
(ඇ) පළාත් පාලනය.
(ඈ) මහජන සංවිධාන.
(ඉ) රාජ්‍ය ව්‍යාපාර සංවිධානය කිරීම.
සටහන : - සාමාර්ථයන් සඳහා සම්පූර්ණ ලකුණු සංඛ්‍යාවෙන් 40% ක් විභාගාපේක්ෂකයෙකු විසින් ලබා ගත යුතු වේ.
(3) කළමනාකරණය හා සංවිධානය
(අ) කළමනාකරණය සහ සංවිධානය පිළිබඳ මූලධර්ම
(ආ) එම මූලධර්ම රාජ්‍ය අංශයේ ගැටළු හා ප්‍රශ්න සම්බන්ධයෙන් උපයෝගී කර ගැනීම.
(ඇ) කළමනාකරණය පිළිබඳ නූතන ක්‍රම හා ශිල්පීය න්‍යායයන් ගැන විභාගාපේක්ෂයාගේ දැනීම මැන ගත හැකි වන අයුරින් මෙම විෂය පිළිබඳ ප්‍රශ්න පත්‍රය සකස් කරනු ඇත.
සටහන : - සාමාර්ථය සඳහා සම්පූර්ණ ලකුණු සංඛ්‍යාවෙන් සියයට 40 ක් විභාගාපේක්ෂකයෙකු විසින් ලබා ගත යුතුය.

ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය

"ආ" පරිශිෂ්ඨය

ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ නිලධාරීන් සඳහා වූ පළමු වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය
(අ) පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය පහත සඳහන් විෂයයන්ගෙන් පැය තුනක ප්‍රශ්න පත්‍ර 4කින් සමන්විත වේ.
(1) රජයේ මූල්‍ය පටිපාටි
(2) නීතිය හා කළමනාකරණය
(3) පරිපාලනය
(4) වාර්තා ලිවීම හා කළමනාකරණය වෙත තොරතුරු ඉදිරිපත් කිරීම.
(ආ) පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගයෙන් විෂයයන්ට එකම අවස්ථාවක දී හෝ නිලධාරියා කැමති නම් වෙන් වෙන් අවස්ථා වලදී පෙනී සිටිය හැකිය.
(ඇ) සාමාර්ථය සඳහා අයදුම්කරුවන් සෑම ප්‍රශ්න පත්‍රයක් සඳහාම 40%ක් ලකුණු ලැබිය යුතුය.

විෂය නිර්දේශය :-
(1) *රජයේ මුදල් ක්‍රියා පටිපාටි* - රජයේ ගණුදෙනුවලට මුදල් රෙගුලාසි හා භාණ්ඩාගාරයේ චක්‍රලේඛ යොදාගැනීම ආදායමට ඇති සම්බන්ධතාවය අනුව මුදල් රෙගුලාසි/ක්‍රියාපිළිවෙත්, වියදම් විදේශ ආධාර වාර්ෂික හා අතිරේක ඇස්තමේන්තු, රජයේ ණය, සැපයීම්, ටෙන්ඩර්, අග්‍රිමය හා අත්තිකාරම් මුදල, අනුඥාත, දිවයිනේ ගිණුම් කාර්යබද්ධ හා ආර්ථික වර්ගීකරණයන්, වැඩසටහන් හා කාර්යසාධන අයවැය, මුදල් අමාත්‍යවරයාගේ කාර්යයන්, මහා භාණ්ඩාගාරය, ප්‍රතිපත්ති සම්පාදන හා ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශය, ලේකම්වරු, විගණකාධිපති හා රජයේ ගිණුම් කමිටුව සම්බන්ධයෙන් රජයේ මුදල් රෙගුලාසි හා භාණ්ඩාගාර චක්‍රලේඛ යොදාගනු ලබන ආකාරය පිළිබඳව අයදුම්කරුවන්ගේ දැනීම පරීක්ෂා කෙරේ.

(2) *නීතිය හා කළමනාකරණය* -
නීතිය :
නීතිය පිළිබඳව නිර්වචනය,
ශ්‍රී ලංකාවේ නීති පද්ධතිය,
ශ්‍රී ලංකාවේ අධිකරණ පද්ධති,
ගිවිසුම් නීතිය,
නියෝජිතායතන නීතිය,
භාණ්ඩ විකිණීම,
වාරික මුදල් ගෙවීමේ ක්‍රමයට මිලදී ගැනීම,
ගනුදෙනු කළහැකි පිලිනයන්,
ඇප සහතික කිරීම,
රක්ෂණය.
කළමනාකරණය :
කළමනාකරණය පිළිබඳ හැඳින්වීම,
කළමනාකරුවන්ගේ කාර්යයන් හා දක්ෂතා,
සැළසුම් ක්‍රියාවලිය හා සංවිධාන මට්ටම් ඇති කිරීම,
සංවිධාන ව්‍යුහය,
මානව සම්පත් කළමනාකරණය,
කාර්ය සාධනය ඇගයීම,
ප්‍රවර්ධනය,
අභිප්‍රේරණය,
නායකත්වය,
සංනිවේදනය,
තීරණ ගැනීම,
ගැටළු නිරාකරණය,
වෙනස්වීම් කළමනාකරණය,
කළමනාකරණ ගැටුම්,
කළමනාකරණ කාලය,
තත්ත්ව චක්‍ර හා නිෂ්පාදන හා ඵලය,
කළමනාකරණ ආචාර ධර්ම හා වගකීම

(3) පරිපාලනය - ආයතන සංග්‍රහයේ 1 වැනි හා 11 වැනි කොටස්වල විධිවිධාන සම්බන්ධයෙන් අයදුම්කරුවන්ගේ දැනුම පරීක්ෂා කෙරේ.

(4) *වාර්තා ලිවීම හා කළමනාකරණය වෙත තොරතුරු ඉදිරිපත් කිරීම.* -
කළමනාකරණ තොරතුරු සම්බන්ධයෙන් කාලානුරූපවීමේ නිරවද්‍යතාවය සහ පරිපූර්ණ බවෙහි වැදගත්කම.
ආශ්‍රය තොරතුරු පරිහරණය,
කාලානුරූප හා තදුචිත වාර්තා,
රැස්වීම් වාර්තා හා සටහන් ලිවීම,
කළමනාකරණය වාර්තා ව්‍යුහය,
විශේෂයක් දැක්විය යුතු වැදගත් ප්‍රතිඵල,
ප්‍රතිඵල අර්ථකථනය,
විචල්‍යයන් යෝජනා කිරීම,
දත්ත විශ්ලේෂණයේදී සංඛ්‍යානමය ක්‍රම භාවිතය,
කාර්ය සාධන සැසඳීම,
කළමනාකරණ වාර්තාවල අනුපාත හා ප්‍රතිශත භාවිතය,
රේඛා චිත්‍ර මගින් නිරූපනය,
වෘත්තීමය කථා හා දේශනවලට සවන්දීම,
කථනයෙන් දේශන වාර්තා කිරීම,
විෂය මඩුලු සාකච්ඡා,
සම්මන්ත්‍රණ දක්ෂතා,
කථාවක් පැවැත්වීම,

"ඈ" පරිශිෂ්ඨය

(ආ) ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ නිලධාරීන් සඳහා වන 2 වැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයේ නිර්දිෂ්ට පත්‍රය පහත දැක්වෙන විෂයයන්ගෙන් සමන්විත වේ.
1. කළමනාකරණ ගණකාධිකරණය,
2. රාජ්‍ය මුදල් කළමනාකරණය,
3. කළමනාකරණය හා සංවිධානය.

නිලධාරීන්ගේ මනාපය පරිදි දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය සඳහා නියමිත විෂයයන් සියල්ලට එකවර හෝ වෙන් වෙන් වශයෙන් හෝ ඔවුනට පෙනී සිටිය හැක. සාමාර්ථයක් ලබා ගැනීම පිණිස එක් එක් ප්‍රශ්න පත්‍රයක් සඳහා ලකුණු වලින් 40%ක් අපේක්ෂකයන් ලබාගත යුතුය.

විභාග පරිපාටිය

කළමනාකරණ ගණකාධිකරණය - පැය 3 ක ප්‍රශ්න පත්‍රයකි.

(1) *කළමනාකරණ ගණකාධිකරණය :*
නිර්දිෂ්ඨ පත්‍රය - ගිණුම් ප්‍රතිපෝෂණය පිළිබඳ පාලනය න්‍යාය, විවෘත සහ සංවෘත දරන ක්‍රම මූලික හා ව්‍යවහාරික ප්‍රශස්ත, සම්මත පිරිවැය ක්‍රම, කාර්යඵල ප්‍රමිති සහ ඇගයුම් ප්‍රමිති පිළිබඳ මූලධර්ම සහ ඒවා යොදා ගැනීමේ ව්‍යවහාර ක්‍රම, ප්‍රමිති සංශෝධනය, ඉගෙනුම වක්‍ර සහ අභිප්‍රේරණය නිර්නය කිරීම, විචලනයන් සහ උපවිචලනයන් විශ්ලේෂණය කිරීම, ඒවායේ වැදගත්කම ඉදිරිපත් කිරීම සඳහා විභාග කිරීම පාලන ගණකාධිකරණයේ චර්යායන්ත අංශයන්, අයවැය ලේඛන සම්පාදනය කිරීමේ සංකල්පය, අයවැය පාලනය පිළිබඳ පරිපාලනය, අයවැය ලේඛන සංග්‍රහය ස්ථාවර හා නම්‍ය අයවැය ලේඛන, ප්‍රධාන සහ අතුරු අයවැය ලේඛන, අයවැය කේන්ද්‍ර, අයවැය පිළියෙල කිරීමෙහිලා කළමණාකරණ සහභාගිත්වය, මැදිහත්වීම සහ අභිප්‍රේරණය, අයවැය කාලසීමාව සහ ප්‍රධාන අයවැය සාධකය හඳුනා ගැනීම.

(2) *රාජ්‍ය මුදල් කළමණාකරණය :*
රාජ්‍ය මුදල් කළමණාකරණය - පැය 3 ක ප්‍රශ්න පත්‍රයකි. ප්‍රශ්න තෝරා ගැනීමට ඉඩදෙනු නොලැබේ.
රජයේ ගණකාධිකාරීවරයාගේ කාර්ය භාරය -
රාජ්‍ය මූල්‍ය පිළිබඳ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාමය සහ නෛතික රාමුව, ආයතනික රාමුව, මධ්‍යම ආණ්ඩුව රාජ්‍ය සංස්ථා, පළාත් පාලන ආයතන, සමුපකාර ව්‍යාපාරය යනාදිය.
පාර්ලිමේන්තුවේ පාලනය, මහා භාණ්ඩාගාරයේ කාර්යයන්, ක්‍රම සම්පාදන අමාත්‍යාංශය ඇස්තමේන්තු කාරක සභාව, විගණකාධිපති, රාජ්‍ය ගිණුම් කාරක සභාව, ඒකාබද්ධ අරමුදල, පාර්ලිමේන්තුව මගින් කරනු ලබන පාලනය පිළිබඳ ගැටළු.
මූල්‍ය චක්‍රය, ක්‍රමසම්පාදන වැඩ සටහන් සැකසීම, අයවැය ලේඛන සම්පාදනය අරමුදල අනුමත කිරීම ගිණුම් තැබීමේ කටයුතු වාර්තා කිරීම ඇගයුම් සහ විගණනය.
ව්‍යාපෘති අගයනය කිරීම, සේයා මිළ ගණන් සහ සංඛ්‍යානමය දත්තභාවිතය ගෙවීම් න්‍යාය සහ අපේක්ෂිත අගය තීරණය කිරීම.
පිරිවැය ප්‍රතිලාභ විශ්ලේෂණය - වට්ටම් කළ මුදල් ප්‍රවාහය, අභ්‍යන්ත ඵල අනුපාතිකය ව්‍යාපෘති තත්වායනය, ව්‍යාපෘති සම්පාදනය සහ අගයනය කිරීම පිළිබඳ ආර්ථික මූල්‍ය හා කළමනාකරණ අංශ සාර්ථක ලෙස ව්‍යාපෘති ඉදිරිපත් කිරීම.
වැඩ සටහන් සම්පාදනය කිරීමේ ශිල්පීය ක්‍රම, ජාල වැඩ විශ්ලේෂණ ක්‍රම භාවිතා කිරීම, සම්පත් පැවරීම, ප්‍රවාහනය පිළිබඳ ගැටලූ ප්‍රයෝජනයට ගැනීම හෝ කාලයාගේ අවැමෙන් පිරිහීමට පත්වන වත්කම් සහ එසේ පිරිහීමට පත් නොවන, එහෙත් යම් කලක් පාවිච්චි කිරීමෙන් හෝ කලක් ගතවීමෙන් පසුව නිශ්ඵල බවට පත්වන වත්කම් වෙනුවට වත්කම් යෙදීම කාර්ය සාධන අයවැය ලේඛන, මූලික ක්‍රම, ස්ථාපනය සහ භාවිතය, කාර්ය සාධනය මැනීම, මිණුම්, වර්ග ඒකක සහ ප්‍රතිමාන තේරීම, ගිණුම් ක්‍රම සහකාර්ය සාධක විශ්ලේෂණය,
වැඩ සටහන් අයවැය, වැඩ සටහන් ව්‍යුහය, කාර්යයන් අනුව වර්ගීකරණය වැඩ සටහන් කටයුතු වැය ව්‍යාපෘතීන් සහ වැය විෂයයන් ආර්ථික සහ කාර්ය බද්ධ වර්ගීකරණය, මූල්‍ය පාලන ක්‍රම, වගකීම් භාරය, අභ්‍යන්තර පාලනය සහ මුදල් රෙගුලාසි, අභ්‍යන්තර විගනණය, කාර්යක්ෂමතා විගණනය, කළමනාකරණ විගණනය, විචල්‍යතා විශ්ලේෂණය, සහ ප්‍රාග්ධන අයවැය සම්පාදනය කිරීම පිළිබඳ තීරණය දිගු කාලීන ක්‍රම සම්පාදනය සහ එහි වැදගත්කම, පූර්වකථනය කිරීම නිරවද්‍යතාවය සහ සීමාවන්, අවදානම් විශ්ලේෂණය, තීරණ වෘක්ෂ, සම්භාවිත සාධක.
ප්‍රාග්ධනය සඳහා ඉල්ලුම - ප්‍රාග්ධන ඵලදායකත්වය සහ ඉපයුම් ඇස්තමේන්තු කිරීම පිළිබඳ ගැටළු, ව්‍යාපෘති ප්‍රමුඛතාවයන් තත්වායනය කිරීමේ දී අවිනිශ්චිතතාවයන් සඳහා ඉඩ තැබීම, පිළිගෙවුම් නිශ්චායකයන්, ඵල අනුපාතිකය ගණනය කිරීම, ශුද්ධ වර්තමාන අගය සහ වට්ටම් කළ මුදල් ප්‍රවාහයේ ප්‍රතිලාභ අයබදු ගැනීමේ බලපෑම, ආයෝජන ප්‍රෝත්සහනය ව්‍යාපෘති පිරිවැය පාලනය සහ පශ්චාත් විගණනය.
හැකියා පිළිබඳ තීරණ - නිෂ්පාදන ප්‍රකීර්ණකය, නිෂ්පාදනය කිරීම් හෝ මිලට ගැනීම, විකල්ප නිෂ්පාදන ක්‍රම, කර්මාන්තශාලා වසාදැමීම පිළිබඳ ගැටළු, මිලකිරීමේ ප්‍රතිපත්ති සහ දායක න්‍යාය, පාරිභෝගික ඉල්ලුම් රටාවන්ගේ බලපෑම, ඉල්ලුම් නම්‍යතාව, අලෙවි කිරීමේ උපාය මාර්ග, කාර්ය සාධන ඇගයීමේ ශිල්ප ක්‍රම, ලාභදායකත්වය පිළිබඳ නිශ්චායකයන් සහ අනුපාත.
ආයෝජන කරන ලද ප්‍රාග්ධනයෙන් ලබන ඵලදාව, ආයෝජනය කරන ලද ප්‍රාග්ධනයේ ස්වභාවය සහ එය ආගනණය කිරීම, දෙපාර්තමේන්තු අතර සංසන්දනය කිරීමේ කාර්යයන් සඳහා කාර්ය සාධන නිශ්චායකයන්.
පිරිවැය වාසි විශ්ලේෂණය, කාරක ප්‍රාග්ධන කළමනාකරණය.
රාජ්‍ය වාණිජ ව්‍යාපාරවල මුදල් පාලනය, අයවැය සම්පාදනය, කළමනාකරණ වාර්තා කිරීම.
ගිණුම් අර්ථකථනය සහ මුදල් අනුපාත භාවිතය.
රාජ්‍ය ව්‍යවසායන්හි මිල නියම කිරීම.
ගිණුම් සැලැස්ම අන්තර්ගත කරුණු, රජයේ වාර්තා සහ රාජ්‍ය ව්‍යාපාර.

සටහන. - සාමාර්ථය සඳහා සම්පූර්ණ ලකුණු සංඛ්‍යාවෙන් සියයට 40ක් විභාගාපේක්ෂකයකු විසින් ලබාගත යුතුය.

(3) කළමනාකරණය සහ සංවිධානය - පැය 3ක ප්‍රශ්න පත්‍රයකි.

කළමනාකරණය සහ සංවිධාන මූලධර්ම පිළිබඳ අපේක්ෂකයාගේ අවබෝධය, රාජ්‍ය අංශයේ ගැටළු සහ ප්‍රශ්න සම්බන්ධයෙන් මෙම මූලධර්ම භාවිතය මෙන්ම නවීන කළමනාකරණය උපක්‍රම සහ ශිල්ප ක්‍රම පිළිබඳ ඔහුගේ දැනුම නිර්මානය කිරීම පිනිස මෙම විෂය අලලා ප්‍රශ්න සකස් කරනු ලැබේ.

"ඉ" පරිශිෂ්ටය

සිංහල

සිංහල පරීක්ෂණය ලිඛිත හා වාචික යන කොටස් වලින් සමන්විතවේ. ලිඛිත පරීක්ෂණය පැය 2 ක කාලසීමාවක් සඳහා වන අතර, පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් ප්‍රශ්න එහි අඩංගු වේ.

i. ව්‍යාකරණ
ii. නොයෙක් ආකාරයෙන් වැල් අකුරුවලින් ලියන ලද පෙත්සම් හෝ ගම්මුලාදැනි හෝ ග්‍රාමසේවා නිලධාරි වාර්තා ඉංග්‍රීසියට පෙරළීම.
iii. ඉංග්‍රීසි රාජකාරි ලිපියකින් හෝ ලේඛනයකින් හෝ ගත් කොටසක් සිංහලයට පෙරළීම.

වාචික පරීක්ෂණය සඳහා පහත සඳහන් දෑ අඩංගු වේ. -

i. ඉංග්‍රීසියෙන් ලියා ඇති රාජකාරි කරුණු සිංහලයකු විසින් වටහාගෙන ලියාගතහැකි වනපරිදි සිංහලෙන් කියවීම.
ii. සිංහල පෙත්සම් කියවීම.
iii. කථාව හා භාෂා පරිවර්තනය - මෙම පරීක්ෂණයේ අදහස වනුයේ ඒ ඒ පංතිවල සිංහල තේරුම් ගැනීමට ද, සාමාන්‍ය කථාවේ දී හා සිරිත් පරිදි කෙරෙන රාජකාරි කටයුතු වලදී තමාගේ අදහස් ප්‍රකාශ කිරීමට ද, අපේක්ෂකයාට ඇති හැකියාව මැනීම වේ.

සටහන - සාමාර්ථයක් සඳහා සම්පූර්ණ ලකුණු සංඛ්‍යාවෙන් 40%ක් විභාගාපේක්ෂකයකු විසින් ලබාගත යුතුය.

දෙමළ

දෙමළ පරීක්ෂණය ලිඛිත හා වාචික යන කොටස් වලින් සමන්විත වේ. ලිඛිත පරීක්ෂණය පැය 2ක කාලසීමාවක් සඳහා වන අතර, පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් ප්‍රශ්න අඩංගු වේ. -

(i) ව්‍යාකරණ
(ii) නොයෙක් ආකාරයේ වැල් අකුරුවලින් ලියන ලද පෙත්සම් හෝ ගම්මුලාදැනින් හෝ ග්‍රාම සේවා නිලධාරීන් වාර්තා ඉංග්‍රීසියට පෙරළීම.
(iii) ඉංග්‍රීසි රාජකාරි ලිපියකින් හෝ ලේඛණයකින් හෝ ගත් කොටස් දෙමළයට පෙරළීම.

වාචික පරීක්ෂණය සඳහා පහත සඳහන් දෑ අඩංගු වේ.

(i) ඉංග්‍රීසියෙන් ලියා ඇති රාජකාරි කරුණු දෙමළ අයෙකු විසින් වටහාගෙන ලියාගත හැකි වන පරිදි දෙමළෙන් කියවීම
(ii) දෙමළ පෙත්සම් කියවීම
(iii) කථාව හා භාෂා පරිවර්තනය - මෙම පරීක්ෂණයේ අදහස වනුයේ ඒ ඒ පන්ති වල දෙමළ තේරුම් ගැනීමට ද සාමාන්‍ය කථාවේදී හා සිරිත් පරිදි කෙරෙන රාජකාරී කටයුතු වලදී තමාගේ අදහස් ප්‍රකාශ කිරීමට ද අපේක්ෂකයාට ඇති හැකියාව මැනීම වේ.

සටහන - සාමාර්ථය සඳහා සම්පූර්ණ ලකුණු සංඛ්‍යාවෙන් 40% ක් විභාගාපේක්ෂකයෙකු විසින් ලබා ගත යුතුය.

ඉංග්‍රීසි

ආදර්ශ ප්‍රශ්න පත්‍රයක් අපේක්ෂකයින්ගේ දැන ගැනීම පිණිස මෙහි පහළින් දක්වා ඇත.

Part A

(a) Fill in the blanks with the correct form of the verb given within brackets :-

During the last war our contry ..... I (be) a British Colony ..... 2 (take) a full part in the war effort. Consequently our tea, rubber and coconut ..... 3 (ship) to Britain at very favourable prices and the foreign exchange we .....4 (earn) ..... 5 (accumulate) as assets. Again during the Korean war in the early fifties our poducts ..... 6 (fetch) good prices and we ..... 7 (not have) any exchange problem. However, political independence ..... 8 (not given rise) to any effort to ..... 9 (build up) our economy we ..... 10 (be) a nation of consumers goods which ..... 11 (squander) our foreign exchange on consumer goods which .....12 (can produce) locally and incidentally diversified our economy. Over the last decade we ..... 13 (begin) to feel the pinch when our primary products ..... 14 (fail) to command good prices in the world market while our requirements of food both rice and subsideary food stuffs .....15 (rise) in price.

(b) Fill in the blanks with the correct preposition (where necessary)'-

As Assistant Secretary..... 16 charge..... 17 subjects, it was my duty to convene groups of officers dealing .....18 different aspects of development work in the Ministry ..... 19 time to time. They discussed ..... 20 various problems that they confronted and which they could not cope ..... 21 on their own. We were thus able to share our experience .....22 each other and make concrete proposals ..... 23 the Secretary every month. He in turn put ..... 24 his own plans for discussion ..... 25 these meetings.

(b) Underline the correct letters given within brackets that would complete the spelling of the following works :-

26. har …… ment (rass/as/ass)
27. ember …… (rass/as/ass)
28. tol …… (arreance/ erance/erence)
29. Par …… arian (liament/ limen/liment)
30. bal …… ing (let/ lat/ lot)
31. itin …… (erary/arary/erarie)
32. Pers …… (everance/everence/ewerence)
33. bour …… (geoise/joursie/juwarsy)
34. prolet …… (ariet/ariat/eriyat)
35. com …… ate (memorr/ emor/memor).

(c) In each of the following statements underline the correct word within brackets :-

36. The inventory was cheked by the Board of (Surveillance/Survey/Surveyors)
37. At the enquiry I had to be satisfied that the accused officer has (contradicted/ contravened/contaminated) the regulations.
38. Every receipt should have a (counterfoil/counterfeit/counterpane) for the purpose of audit.
39. There was a possibility that the prosecution had (fabricated/fumigated/pro mulgate) the evidence.
40. (Discrete/Discretionary/Discriminatory) power was given to the Head of the Department under the relevant Act.
41. The Police Party had (laid/lied/lain) in ambush until the bribe taker arrived.
42. The entire staff turned upon (facilitate/infiltrate/felecitate) the watcher on his retirement.
43. In times of national crisis we must avoid (luxuriant/luxurious) habits.
44. Martial music was played over the radio during height of the battle to keep up the (moral/morale/morals) of the people.
45. Candidates are advised to use (Stationary/Stationery) sparingly owing to the acute paper shortage.

(e) Underline the correct phase in the brackets that means the same as the word or phrase underlined in each sentence.

46. In good Management the boss should, support his staff in their work (back out/back up/back away).
47. The sales and replacement of stock amounted to over Rs. 5,000 (turn out/ turn up/turn away).
48. We were warned at the start not to let out work get into arrears (set out/out set).
49. The younger son wasted his father's wealth in a few years (ran over/ran through).
50. I wanted to see the film, but the queue deterred me from going (put away/put off).

Part B

Read the following passage carefully and then answer the questions set out below :-

Most modern political ideals such, for example, as justice, liberty, constitutional government, and respect for the law or at least the definitions of them, began with the reflection of Greek thinkers upon the institutions of City State. But in the long history of political thought the meaning of such terms has been variously modified and always that meaning has to be understood in the light of the institutions by which the indicates were to be realized and of the society in which those institutions did their work. The Greek City States was so different from the political communities in which modern men live. that it requires no small effort of the imagination to picture its social and political life. The Greek Philosophers were thinking of political practices far different from any that have prevailed commonly in modern word, and the whole climate of opinion in which the work was done was different. Their problems though not without their analogies in the preset, were never identical with modern problems and the ethical apparatus by which political life was evaluated and criticized varied widely from any that now prevails. In order to understand at all accurately what their theories meant it necessary first to realize at least roughly what kind of institutions they had in view and what citizenship connected as an effect and as an ideal, to the public for whom they wrote. For this purpose the Government of Athens is especially important, partly because it is the best known, but chiefly because it was an object of special concern to the greatest of Greek Philosophers.

As compared with modern states the ancient City-State was exceedingly small both in area and in population. The numbers were exceedingly uncertain but, a figure somewhat in excess of three hundred thousand would be approximately correct. Such an arrangement of a small territory denominated by a single City was typical off the City State.

In each of the following cases, choose the alternative which in your opinion supports the views expressed in the above passage. Place a tick (right mark) against the correct answer.-

51. Athens is significant for the students of Greek political thought mainly because :-
(a) it was the most powerful of the Greek City-States ;
(b) its ideals had been carefully studied by the Greeks themselves ;
(c) it had the most ideal form of Government ;
(d) it is the best known of the Greek City-States.

52. Greek political thought was concerned with problems :-
(a) entirely unrelated to.
(b) identical with.
(c) different from analogous but to.

53. The moral and religious basis of Greek political idea is :-
(a) very similar to modern moral and religious ideas ;
(b) unknown ;
(c) very different from modern moral and religious ideas.

54. It is :-
(a) easy,
(b) not at all easy,
(c) impossible,
for a modern man to imagine what life was like in a Greek City-State.

55. In comparison with the ancient Greek City States are :-
(a) very large,
(b) very small,
(c) about the same size.

56. The population of an ancient Greek City States was :-
(a) much less than 300,000,
(b) over 3 million,
(c) Just over 300,000.

57. The City-State of Athens comparis :-
(a) a small territory governed by a singly city,
(b) a large territory governed by a number of cities,
(c) a small territory with village councils,
(d) a large territory with a decentralised administration.

58. At different times in the history of the world people :-
(a) have thought in basically the same way,
(b) have thought in different ways,
(c) have contradicted the views of people of the previous generation.

59. Details of political theory are derived from Greek Political thought :-
(a) because the Greek City States was very similar to modern states,
(b) in spite of Greek City State being very different from modern States,
(c) because modern political theorists are students of Greek Philosophy.

60. The meaning of political ideal at the particular moment in European History since the time of the Greeks can be defined only be :-
(a) relating it to its context,
(b) tracing it back to its original meaning among the Greeks,
(c) investigating the meaning of the Greek word for it,
(d) taking into account only those features in it which have persisted throughout its history.

61. Write sentences using each of the following words so as to bring out its meaning clearly :-

Arbitration, emoluments, etiquette, consolidate, hypothetical, retrospective, exigencies, evaluate, review, empower.

EITHER

62. Write a letter to the Head of an Educational Institute in an English speaking country, setting out the following information in an orderly manner :-
(i) The equivalence of our examination certificate to the certificate specified in this letter cannot be determined as the examining authorities in Sri Lanka have not been consulted by the institution concerned in that country.
(ii) The G. C. E. (Ordinary Level) Credit Pass has been officially equated with an Ordinary Pass in London G. C. E. (Ordinary Level) .
(iii) The receipt of the letter sent to the Commissioner of Examinations is acknowleged.
(iv) Any further information in this matter may be obtained from the embassy of the Republic of Sri Lanka in that country.

63. Write a memorandum to the Secretary, Bureau of Standards marking out a case for the adoption of the 24 hour clock in this country staning the advantages of such a measure.

ආදර්ශ අයදුම්පත්‍රය

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා ☐

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවයේ ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ ශ්‍රී ලංකා පොලිස් සේවයේ සහ ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ නිලධාරීන් සඳහා වූ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සහ දෙවන භාෂාව පිළිබඳ පරීක්ෂණය - 2004

ඉල්ලුම් කරන නගරය කොළඹ ☐
යාපනය

(අදාළ කොටුවේ ✓ යොදන්න)

දෙපාර්තමේන්තු ප්‍රධානියා මාර්ගයෙන් විභාග කොමසාරිස් ජනරාල් වෙත ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතුය.
(විභාගයේ නම කවරයේ වම් පැත්තේ ඉහළ කෙළවරේ දැක්විය යුතුය)

01. (අ) i. අගට යෙදෙන නම්, මුල් අකුරු සමග :————————.
(සිංහලෙන්/ඉංග්‍රීසියෙන්)
ii. අගට යෙදෙන නම් මුල් අකුරු සමග :————————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
(ආ) i. මුල් අකුරු වලින් හැඳින්වෙන නම් :————————.
(සිංහලෙන්/දෙමළෙන්)
ii. මුල් අකුරු වලින් හැඳින්වෙන නම් :————————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

02. ලිපිනය (ප්‍රවේශ පත්‍ර එවීම සඳහා) :————————.

03. නිලධාරියා ඉල්ලුම් කරන විභාගයේ නම :————————.
සටහන - මෙය සම්පූර්ණ කිරීමට පෙර 4 (ආ) බලන්න

04. නිලධාරියා විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :————————.

05. i. නිලධාරියා අයත් සේවය :————————.
ii. එම සේවයට පත් කරනු ලැබූ දිනය :————————.

06. නිවේදනයේ පළමු ඡේදයේ දක්වා ඇති විෂය අංක සහිතව ගන්නා විෂයයන් පැහැදිලිව සඳහන් කළ යුතුය.
(ඉල්ලුම් පත්‍රයේ සඳහන් විෂයයන් වලට අමතරව වෙනත් විෂයයන් වලට පෙනී සිටීමට ඉඩදෙනු නොලැබේ.)

i. විෂය අංකය
ii. විෂය අංකය
iii. විෂය අංකය
iv. විෂය අංකය
v. විෂය අංකය
vi. විෂය අංකය
vii. විෂය අංකය

07. උපන් දිනය : වර්ෂය:———. මාසය:———. දිනය :———.
08. තනතුර :———————.
දෙපාර්තමේන්තුවේ නම :———————.
09. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරියෙකු නම්, නිලධාරියා එම සේවයට පත් කරනු ලැබූ දිනය :———————.
10. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරියෙකු නොවේ නම්, නිලධාරියා අයත් සේවය :———————.
11. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරියෙකු නම්, නිලධාරියා ඉල්ලුම් කරන විභාගය :———————.
(අදාළ නොවන දෑ කපා හරින්න)
(අ) පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය (අ) :———————.
(ආ) දෙවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය (ආ) :———————.
(ඇ) දෙවැනි භාෂාව පිළිබඳ පරීක්ෂණය (ඇ) :———————.
12 .ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධරයෙකු නොවේ නම් නිලධාරියා ඉල්ලුම් කරන විභාගය (අදාළ නොවන දෑ කපා හරින්න):——— .
13. මීට ප්‍රථම මෙම විභාගයට මුළුමනින්ම හෝ කොටසක් වශයෙන් හෝ පෙනී සිට ඇත්දැයි සඳහන් කරන්න. එසේ නම් වි ෂයයන් ද වර්ෂය හා මාසය සඳහන් කරන්න. :————.

ඉහත දැක්වෙන විස්තර නිවැරදි බවත්, ඉහත 4 වැනි ඡේදයේ දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් මෙම විභාගයට පෙනී සිටීමට හිමිකම් ඇති බවත් ප්‍රකාශ කරමි.
* මෙම ඉල්ලුම්පත්‍රයට අලවන ලද මුද්දර මවිසින්ම අවලංගු කිරීමට පෙර වලංගු වූ, පාවිච්චි නොකරන ලද ඒවා බවද ප්‍රකාශ කරමි.
14 ගෙවන ලද විභාග ගාස්තුව රු :————.

මුද්දර කොටුව

———————,
අපේක්ෂකයාගේ අත්සන.

දිනය :————.

විභාග කොමසාරිස් ජනරාල්,
ඉදිරිපත් කරමි.
මේ විස්තර දැක්වෙන මයා/මිය/මෙනෙවියට මෙම විභාගයට පෙනී සිටීමටත්, 04 වැනි ඡේදයේ ඔහු/ඇය විසින් දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් මෙම විභාගයට පෙනී සිටීමටත්, ඔහුට/ඇයට සුදුසුකම් ඇත.
අපේක්ෂකයාගේ අත්සන සහතික කරමි.

———————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන හා තනතුර.

දිනය :————.
06-141

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

I වැනි කොටස : (IIආ) වැනි ජෙදය - පලකිරීම්

ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

ශ්‍රී ලංකා දුම්රිය සේවය

ජන්ෂන් පිෂ් ප්ලේට්ස් යුගල 950 ක් මිළදී ගැනීම සඳහා ටෙන්ඩර් කැඳවීම

01. කොළඹ 10, ඕල්කොට් මාවතේ, පිහිටි ශ්‍රී ලංකා දුම්රිය සේවයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් පහත සඳහන් විෂයයන් මිළදී ගැනීම සඳහා නිෂ්පාදකයින්/සැපයුම්කරුවන් විසින් ඉදිරිපත් කරන මුද්‍රා තබන ලද ටෙන්ඩර්පත් භාරගනු ලැබේ.

විෂයය	ප්‍රමාණය
ජන්ෂන් පිෂ් ප්ලේට්ස් 80/90ඒ රේල්පීලි සඳහා (Junction fish plates)	යුගල 600
එම 88/90ඒ රේලිපීලි සඳහා (Junction fish plates)	යුගල 350

ඇටෝර්නි බලය පවරනු ලැබූ නියෝජිතයින් මගින්ද නිෂ්පාදකයින්ට ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ හැකිය.

02. ටෙන්ඩර්පත් සඳහා ආපසු නොගෙවනු ලබන රු. 2,500 ක මුදලක් ගෙවා කොළඹ 10, ඕල්කොට් මාවතේ, පිහිටි දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලයෙන් 2004.07.05 දින ප.ව. 3.00 ට (ශ්‍රී ලංකා වේලාවෙන්) පෙර ලබා ගන්නා ආකෘති පත්‍රවල මිළ ගණන් ඉදිරිපත් කල යුතුය.

03. ටෙන්ඩර් පත් භාර ගන්නා අවසාන දිනය 2004.07.07 දින ප.ව. 2.00ට (ශ්‍රී ලංකා වේලාවෙන්) වේ.

04. මෙම විෂයයෙහි සැලසුම හා නිෂ්පාදනය ISO 9001:2000/BSEN ISO 9001:2000 ට හෝ වෙනත් පිළිගත හැකි ජාත්‍යන්තර තත්ව පාලන ප්‍රමිතීන්ට අනුකූල විය යුතුය.

05. ටෙන්ඩර්පත් බාරගැනීම අවසන්වූ වහාම කොළඹ 10, ඕල්කොට් මාවතේ, දුම්රිය මූලස්ථානයේදී ටෙන්ඩර් පත් විවෘත කරනු ලබන අතර එම අවස්ථාවට ටෙන්ඩර්කරුට හෝ ඔහුගේ බලය ලත් නියෝජිතයින්ට සහභාගි විය හැකිය.

06. මුද්‍රා තබන ලද ටෙන්ඩර්පත් ගෙනවිත් බාරදීමට හෝ පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය හැක.

සභාපති,
ටෙන්ඩර් මණ්ඩලය, ශ්‍රී ලංකා දුම්රිය සේවය,
දුම්රිය මූලස්ථානය,
ඕල්කොට් මාවත,
කොළඹ 10.

07. කොළඹ 10, ඕල්කොට් මාවතේ, දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලයේදී ටෙන්ඩර් ලියකියවිලි නොමිලයේ පරීක්ෂා කර බැලිය හැක. වැඩි විස්තර සඳහා කොළඹ 10, ඕල්කොට් මාවතේ, දුම්රිය ගබඩා අධිකාරී විමසන්න.

දුරකථන අංක 94(1) 2432044 හෝ 94(1)2436818

සභාපති,
ටෙන්ඩර් මණ්ඩලය,
ශ්‍රී ලංකා දුම්රිය සේවය.

06-142

ශ්‍රී ලංකා දුම්රිය සේවය

ශ්‍රී ලංකා දුම්රිය සේවය සඳහා (Foundry Coke) මෙට්‍රික් ටොන් 200 ක් සැපයීම සඳහා වූ ටෙන්ඩරය

සභාපති, ටෙන්ඩර් මණ්ඩලය වෙනුවෙන් ශ්‍රී ලංකා දුම්රිය සේවය තැ. පෙ. 355, කොළඹ 10 විසින් (Foundry Coke) මෙට්‍රික් ටොන් 200 ක් සැපයීම සඳහා නිෂ්පාදකයින්ගෙන් හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින් වෙතින් මුද්‍රා තබන ලද ටෙන්ඩර්පත් භාරගනු ලැබේ.

02. ටෙන්ඩර් පත් භාර ගන්නා අවසාන දිනය 2004.07.08 දින ප.ව. 2.00ට වේ.

03. ශ්‍රී ලංකාව, කොළඹ 10, ඕල්කොට් මාවත, තැ.පෙ. 1347 දරන ලිපිනයේ පිහිටි දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලය වෙත 2004.06.30 දින ප.ව. 3.00 දක්වා කාලය තුළ ආපසු නොගෙවනු ලබන රු. 2,500 ක ටෙන්ඩර් ගාස්තු මුදලක් ගෙවා ලබා ගන්නා ලද ආකෘතිය මත ටෙන්ඩර්පත් ඉදිරිපත් කළ යුතුය.

04. ටෙන්ඩර් පත් භාර ගැනීම අවසන් වූ විගස ශ්‍රී ලංකාව, කොළඹ 10, තැ. පෙ. 355 ශ්‍රී ලංකා දුම්රිය සේවයේ දුම්රිය මූලස්ථානයේදී ටෙන්ඩර්පත් විවෘත කරන අවස්ථාවට ටෙන්ඩර්කරු හෝ ඔහුගේ බලයලත් නියෝජිතයාට සහභාගි වීමට අවසර දෙනු ලැබේ.

05. මුද්‍රා තබන ලද ටෙන්ඩර්පත් පහත සඳහන් ලිපිනයට හෝ අතින් ගෙනවිත් භාරදිය හැක. සභාපති, ටෙන්ඩර් මණ්ඩලය, දුම්රිය මූලස්ථානය, තැ. පෙ. 355, කොළඹ 10, ශ්‍රී ලංකාව.

06. ශ්‍රී ලංකාව, කොළඹ 10, ඕල්කොට් මාවත, තැ.පෙ. 1347 දරන ලිපිනයේ පිහිටි දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලයේදී ටෙන්ඩර් ලියකියවිලි නොමිළයේ පරීක්ෂා කල හැක.

07. වැඩි විස්තර සඳහා කරුණාකර දුම්රිය ගබඩා අධිකාරී, දුම්රිය ගබඩා දෙපාර්තමේන්තුව, තැ.පෙ. 1347, කොළඹ 10, ශ්‍රී ලංකාව යන ලිපිනයෙන් විමසන්න.

දුරකථන අංක 94(11) 2432044 හෝ 94(11)2436818.

සභාපති,
ටෙන්ඩර් මණ්ඩලය,
ශ්‍රී ලංකා දුම්රිය සේවය.

06-143

බඩු බාහිරාදිය විකිණීම්

මහෙස්ත්‍රාත්, අධිකරණය - තඹුත්තේගම

නඩු භාණ්ඩ වෙන්දේසියේ විකිණීම

තඹුත්තේගම මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුවලට අයත් රාජසන්තක කරන ලද හා මෙතෙක් කල් හිමිකම් නොකියන ලද පහත සඳහන් භාණ්ඩ 2004.07.02 වැනි දින පෙ. ව. 10.00 ට අධිකරණ භූමියේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

(2) මෙම වෙන්දේසිය සඳහා ඉදිරිපත් කර ඇති කිසියම් භාණ්ඩයක් පිළිබඳව අයිතිවාසිකම් කියන්නකු වේ නම් ඒ පිළිබඳව වෙන්දේසිය පවත්වනු ලබන දිනයේ පෙ. ව. 9.30 සිට 10.00 දක්වා එකී අයිතිවාසිකම් ඉදිරිපත් කළ යුතුය.

(3) රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය ලබා වෙන්දේසිය ආරම්භ කිරීමට පැය භාගයකට (පැය 1/2) පෙර වෙන්දේසියේ විකිණීමට නියමිත භාණ්ඩ මහජනයාට පරීක්ෂා කර බැලිය හැකිය.

(4) වෙන්දේසියෙහි මිළදී ගන්නා ලද භාණ්ඩ සඳහා එවෙලේම මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතුය. සියලුම ගෙවීම් මුදලින් පමණක් අයකර ගත යුතු අතර, චෙක්පත් හෝ මුදල් ඇණවුම් කිසිවක් භාර ගනු නොලැබේ.

(5) අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලංසුව නොපිලි ගන්නා අවස්ථාවකදී අධිකරණයේ අභිමතය පරිදි එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතුය.

(6) වෙන්දේසියෙන් මිළදී ගනු ලබන භාණ්ඩ භාර ගැනීමේ දී හා මුදල් ගෙවීමේදී තම ජාතික හැඳුනුම් පත ඉදිරිපත් කළ යුතුය.

(7) මිළදී ගන්නා භාණ්ඩ, භාණ්ඩ වෙන්දේසිය පවත්වනු ලබන දිනයේදීම ප. ව. 5.00ට පෙර අධිකරණ භූමියෙන් ඉවත් කළ යුතුය.

මහෙස්ත්‍රාත්,
තඹුත්තේගම.

2004 මැයි මස 10 වැනි දින,
තඹුත්තේගම මහෙස්ත්‍රාත් අධිකරණයේදීය.

වෙන්දේසිය සඳහා භාණ්ඩ ලැයිස්තුව

අනු අංකය	නඩු අංකය	භාණ්ඩ පිළිබඳ විස්තර
01.	21205	අංක 5297455 ලුමාලා පා පැදිය
02.	ඒ 127/01	අංක එච්. ජේ. 88602 හීරෝ අබලන් පා පැදිය
03.	ඒ 412/99	අංක 579762 පා පැදිය
04.	ඒ 1376/96	පී වයි 3524 පා පැදිය
05.	29116	අංක 81 බී 190 අංක අපහැදිලි පා පැදිය
06.	30304	පී. සී. 14957 අබලන් පා පැදිය
07.	32013	අංක අපැහැදිලි පා පැදිය
08.	35442	අංක ආර්. එම්. සී. 44309 පා පැදිය
09.	36271	අංක අපැහැදිලි අබලන් පා පැදිය
10.	24524	අංක එච්. වී. 9395 අබලන් පා පැදිය
11.	ඒ92/2003	අංක 00 ඒ බී 1 582 පා පැදිය
12.	ඒ 178/2002	අංක අපැහැදිලි පා පැදිය
13.	ඒ 70/2003	අංක පී සී 81851 පා පැදිය
14.	- එම -	අංක 752023 පා පැදිය
15.	- එම -	අංක අපැහැදිලි පා පැදිය
16.	- එම -	අංක ආර්. එම්. සී. 32912 පා පැදිය
17.	- එම -	අංක 20 පි 6947 පා පැදිය
18.	- එම -	මවුන්ට පැපැදිය
19.	28865	අංක අපැහැදිලි පා පැදිය
20.	ඒ 689/ 2003	අංක ජී 33676/5 පා පැදිය
21.	- එම -	අංක 799111 පා පැදිය
22.	- එම -	අංක රහිත මවුන්ට පා පැදිය
23.	- එම -	අංක බී 825706 දරන වර්ගය අපැහැදිලි පා පැදිය
24.	- එම -	අංක බී ජේ 517751 දරන අබලන් පා පැදිය
25.	- එම-	අංක බී අයි ඩී. 670 පා පැදිය
26.	ඒ 689/2003	අංක 2750 පා පැදිය
27.	ඒ 667/2003	අංක 092074 පා පැදිය
28.	ඒ 665/2003	අංක 555225308 පා පැදිය
29.	ඒ 813/03	අංක ඒ ඒ 69542 පා පැදිය
30.	ඒ 814/2003	අංක සී. සී. ඩී 389838 පා පැදිය
31.	ඒ 815/2003	අංක අපැහැදිලි පා පැදිය
32.	ඒ 816/2003	අංක 5569844 පා පැදිය
33.	23055	අංක අපැහැදිලි පා පැදිය
34.	38064	අංක අපැහැදිලි පා පැදිය
35.	25899	අබලන් පා පැදිය
36.	44794	අංක අපැහැදිලි පා පැදිය
37.	ඒ 912/2003	අංක අපැහැදිලි පා පැදිය.
38.	24839	අංක අපැහැදිලි පා පැදිය
39.	33736	අංක අපැහැදිලි අබලන් පා පැදිය
40.	28990	අංක 55683715 පා පැදිය
41.	19354	අංක අපැහැදිලි පා පැදිය
42.	23119	අබලන් පා පැදිය
43.	42594	අබලන් පා පැදිය
44.	29008	අංක 106 - 3257 චැලිය හා යතුරු පැදිය
45.	ඒ 877/00	අංක 112 - 5148 යමහා යතුරු පැදිය
46.	28675	අංක 159 - 4321 හොන්ඩා යතුරු පැදිය
47.	ඒ 13/202	අංක 128 7964 යතුරු පැදිය
48.	ඒ 666/2003	අංක 135/6434 යතුරු පැදිය
49.	ඒ 864/02	අංක 128-5230 නිල් පාට යමහා යතුරු පැදිය
50.	ඒ 865/2002	අංක 84 ශ්‍රී 945 දරන හොන්ඩා යතුරු පැදිය
51.	28064	ඉරුම් කියත් 01 යි
52.	28063	ඉරුම් කියත් එකයි පොරව
53.	43268	කියත් එකයි යකඩ ඉනි එකයි. පොරව 01 යි
54.	43676	අත් කියත් එකයි
55.	43752	හරස් කියත් එකයි කැති එකයි
56.	37314	කැති එකයි
57.	38930	කුළු ගෙඩි එකයි අලවංගු එකයි
58.	37940	කොළ කැති එකයි
59.	37504	කැති එකයි
60.	36471	වක් පිහිය එකයි අත් පොරව
61.	22740	ඉරුම් කියත් එකයි
62.	36865	ඉරුම් කියත් දෙකයි
63.	43538	කැති එකයි
64.	30199	ඉරුම් කියත් එකයි පොරව එකයි.
65.	38400	කුළු ගෙඩි 01 යි යකඩ ඉනි එකයි.
66.	35648	බංඩි කියත් එකයි පොරෝ එකයි
67.	ඒ 527/2000	උඩ යට ඉරන කියත් එකයි හරස් කියත් එකයි
68.	25489	බංඩි කියත් එකයි පොරෝ එකයි
69.	43539	රවුම් කියත හා වඩු බංකු එකයි
70.	38309	වයර් මීටර් 22 පමන හෝල්ඩරය
71.	38310	වයර් මීටර් 30 ක් පමන හෝල්ඩරය
72.	38312	වයර් මීටර් 15 ක් පමණ
73.	38313	වයර් මීටර් 10 ක් පමණ
74.	38311	වයර් මීටර් 18 ක් පමණ
75.		තලන ලද තඹ දගර තොගය
76.		විවිධ ප්‍රමාණයේ හිස් වීදුරු බෝතල් තොගය
77.		හිස් බැරල් තොගය

මහෙස්ත්‍රාත්,
තඹුත්තේගම.

06-22

ආණ්ඩුවේ නොවන දැන්වීම්

ඇටෝර්නි බලය අවලංගු කිරීම

සියලු දෙනාම මෙයින් දැන ගනිත්වා

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ, උඩපළාත ගඟඉහල කෝරළේ, උලපනේ, තැඹිලිගල, කහටගස්තැන්නේ, වී. සී. නිවසේ පදිංචි පිහිල්ලේ කුඹුරේ ගෙදර කමලාවතී වන මා විසින්, ගම්පොල ප්‍රසිද්ධ නොතාරිස්, සේනක සරත්චන්ද්‍ර මහතා විසින් සහතික කරන ලද අංක 776 සහ 1999.12.03 වැනි දිනත් දරන ඇටෝර්නි බලපත්‍රය ප්‍රකාර, මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, ගම්පොල, ඇත්ගාල බටහිර, අංක 618 දරන ස්ථානයේ පදිංචි මාගේ සහෝදරියක වන පිහිල්ලේ කුඹුරේ ගෙදර සෝමාවතී වෙත (ජා. හැ. පත් අංක 476081280 වී හිමි) ලබාදෙන ලද ඇටෝර්නි බලපත්‍රය අද පටන් එනම් වර්ෂ 2004 ක් වූ මැයි මස 17 වැනි දින සිට කිසිම ආකාරයක වලංගුභාවයක් නොමැති බවත්, ඉහත කී ඇටෝර්නි බලපත්‍රය සම්පූර්ණයෙන්ම අවලංගුවී අහෝසි වන බවත්, එකී ඇටෝර්නි බලකාරිය විසින් අදින් පසු එළඹෙන කිසිම ගිවිසුමක් හෝ ගනුදෙනුවක් හෝ මොනයම් ආකාරයක නෛතික ක්‍රියාවන් සම්බන්ධයෙන් මාගේ කිසිදු බැඳීමක් හෝ වගකීමක් නොමැති බවත්, ශ්‍රී ලංකා ජනරජයට සහ සකල ශ්‍රී ලංකාවාසී මහජනතාව වෙතද මෙයින් දන්වා සිටිමි.

පිහිල්ලේකුඹුරේ ගෙදර කමලාවතී,
(ජා. හැ. පත් අංක 518331299 වී හිමි)

වර්ෂ 2004 ක් වූ මැයි මස 17 වැනි දින දී ය.

06-35

ඇටෝර්නි බලය අවලංගු කිරීම

මාතර ඉසදීන් නගරයේ, ස්වරාජ් පාරේ, අංක 124 හි සුධර්මන් ලලිත් චන්ද්‍ර විජයවර්ධන වන මම, මාතර, ඉසදීන් නගරයේ, ස්වරාජ් පාරේ, අංක 124 හි වීරසිංහ ආරච්චිගේ ධර්මදාස වීරසිංහ මහතා වෙත ලබා දී තිබූ, මාතර, චන්ද්‍රකුමාර විජය ගුණවර්ධන, ප්‍රසිද්ධ නොතාරිස් තැන සහතික කල 1995.01.17 දිනැති, අංක 15040 දරන ඇටෝර්නි බලය, ඉවත්කොට අවලංගු කල බව මහජනතාවට සහ ශ්‍රී ලංකා ආණ්ඩුවට මෙයින් දැනුම් දෙමි.

සුධර්මන් ලලිත් චන්ද්‍ර විජයවර්ධන.

2004 මැයි මස 06 වැනි දින දී ය.

06-137

ඇටෝර්නි බලය අවලංගු කිරීමයි

කොළඹ 05, ඉසිපතන මාවතේ, ග්‍රීන්ලන්ඩ්ස් ඇවනියු හී අංක 2 හි ට්‍රෙසිලා නමසිවායම් වන මා විසින් ඇමෙරිකා එක්සත් ජනපදයේ, කවුන්ටි ඔෆ් පිමා හී, ස්ටේට් ඔෆ් ඇරිසෝනා හී, ප්‍රසිද්ධ නොතාරිස් වරයෙකු විසින් ලියා සහතික කරන ලද 1993 ජුනි මස 17 වනදා දාතම දරන ඇටර්නි බලය යටතේ කොළඹ 04 ෆ්‍රෙඩ්ස්ක්ෆර්ට් පෙදෙසේ අංක 21 'ඒ' හි දිල්කුෂා පැට්රිසියා උමගිලිය සහ කොළඹ 05, ඉසිපතන මාවතේ ග්‍රීන්ලන්ඩ්ස් ඇවනියු හි අංක 2 හි රොහානා විනිෆ්‍රිඩා ජයරත්න යන අය වෙත ප්‍රදානය කරන ලද බලතල ප්‍රත්‍යාදිෂ්ඨ කොට, අහෝසිකොට, අවලංගු කරන ලද බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුවටත්, පොදු මහජනතාවටත් මෙයින් දන්වා සිටිමි.

ට්‍රෙසිලා නමසිවායම්.

06-37

ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

ඕස්ට්‍රේලියාවේ, ක්වින්ස් ලැන්ඩ් 4000, බ්‍රිස්බේන්, 307 ක්වීන් ස්ට්‍රීට්හි, ලෙවල් 12 ඒ දරන තැන, යූ. ඒ. එස්. ෆාමසූටිකල් පුද්ගලික සමාගම වන අපි, චිත්‍රාල් ජයන්තද සිල්වා අමරතුංග අපේ නීත්‍යානුකූල බලධරයා ලෙස 2001 අගෝස්තු මස 29 වැනි දින ඕස්ට්‍රේලියාවේ සිඩ්නි හි කාසි මැකින්ටොෂ් මහතා ප්‍රසිද්ධ නොතාරිස් ලෙසින් සාක්ෂි දරනු ලදුව පත් කරනු ලැබූ අතර එම ඇටෝර්නි බලය මෙම ප්‍රකාශනය මගින් 2003 දෙසැම්බර් මස 22 සිට ඉල්ලා අස්කරගත් බව දන්වා සිටිමු.

06-176

වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

ණය අංකය : 0400000858.

(මෙහි මින් මතු "එකී පනත" යනුවෙන් සඳහන් කරනු ලබන) 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ, ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව විසින් යෝජනා සම්මත කරනු ලැබ වර්ෂ 2002.11.01 වැනි දින අංක 1261 දරන ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ සහ වර්ෂ 2004.04.15 වැනි දින "දිනමිණ", "ද අයිලන්ඩ්", "තිනක්කුරල්" පුවත්පත් වල පළ කරන ලද නියමය ප්‍රකාර පහත දැක්වෙන මුදල් අයකරගැනීම පිණිස පහත විස්තර කර තිබෙන දේපළ මහනුවර, අරුප්පොල පාර, අංක 64 යන ස්ථානයේ පදිංචි බලයලත් වෙන්දේසිකරු වන අයි. ඩබ්. ජයසූරිය විසින් 2004.06.21 වැනි දින පෙ.ව. 10.00 සිට පහත විස්තර කරනු ලබන දේපළ පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

1. එකී දේපළ උකස මත සංස්ථාවට අයවිය යුතු එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් එක්ලක්ෂ දෙදහස් හැටක (රු. 102,060.00) මුදල ද, 2002.06.30 වන දින දක්වා පොළිය වශයෙන් රුපියල් එක්ලක්ෂ දහහතරදහස් දෙසිය හැටදෙකයි ශත හැත්තෑහයක් (රු. 1,14,262.76) ද, වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් දෙලක්ෂ දහසයදහස් තුන්සිය විසිදෙකයි ශත හැත්තෑහයක් (රු. 2,16,322.76) ද,

2. එකී රුපියල් එක්ලක්ෂ දෙදහස් හැටක (රු. 1,02,060) මුදල මත අයවිය යුතු වර්ෂයකට 17% බැගින් වන පොළියක් 2002.07.01 වැනි දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා අයකර ගැනීම සඳහා ද,

3. එකී 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තිය යටතේ අයකර ගත යුතු මුදල් සහ ගාස්තු අයකර ගැනීමට

දේපල පිළිබඳ විස්තරය

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ දකුණු මාතලේ ගම්පහසියපත්තුවේ ගල්වඩුකුඹුරේ පිහිටි පුස්සැල්ලේගහයාය සහ ඉරවිලියාය යන ඉඩමට ඒ. ජී. ඩබ්. ගිරාගම මානක විසින් 1996.07.08 දින මැන සැදූ පිඹුරු අංක 3991 ප්‍රකාර කැබලි අංක 11බී ට මායිම්, උතුරට : කැබලි අංක 11ඒ ද, නැගෙනහිරට : ගම්සභා පාර ද, දකුණට : කැබලි අංක 11සී ද, බටහිරට : කැබලි අංක 13 ද යන මායිම් තුළ පිහිටි පර්චස් විස්සක (අක්. 0, රූ. 0, පර්. 20) විශාල බිම් ප්‍රමාණය කැබලි අංක 13 හි මාර්ග අයිතිය ද සමග මාතලේ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී. 468/16 හි ලියාපදිංචි වී ඇත.

වර්ෂ 2004 ක්වූ මැයි මස 20 වැනි දින කොළඹ දීය.

ඉහත නම සඳහන් සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය.

සාමාන්‍යාධිකාරී.

06-171

ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

ණය අංකය : 0400000854.

(මෙහි මින් මතු "එකී පනත" යනුවෙන් සඳහන් කරනු ලබන) 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ, ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව විසින් යෝජනා සම්මත කරනු ලැබ වර්ෂ 2002.11.01 වැනි දින අංක 1261 දරන ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ සහ වර්ෂ 2004.04.10 වැනි දින "දිනමිණ", "ද අයිලන්ඩ්", "තිනක්කුරල්" පුවත්පත් වල පළ කරන ලද නියමය ප්‍රකාර පහත දැක්වෙන මුදල් අයකරගැනීම පිණිස පහත විස්තර කර තිබෙන දේපළ මහනුවර, අරුප්පොල පාර, අංක 64 යන ස්ථානයේ පදිංචි බලයලත් වෙන්දේසිකරු වන අයි. ඩබ්. ජයසූරිය විසින් 2004.06.21 වැනි දින පෙ.ව. 10.00 සිට පහත විස්තර කරනු ලබන දේපළ පිහිටි

ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

1. එකී දේපළ උකස මත සංස්ථාවට අයවිය යුතු එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් හැත්තෑහයදහස් අටසිය අනූවයි ශත අසූතුනක (රු. 76,890.83) මුදල ද, 2002.06.30 වන දින දක්වා පොළිය වශයෙන් රුපියල් අනූදෙදහස් හයසිය තිස්දෙකයි ශත නවයක් (රු. 92,632.09) ද, වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් එක්ලක්ෂ හැටනවදහස් පන්සිය විසිදෙකයි ශත අනූදෙකක් (රු. 1,69,522.92) ද,

2. එකී රුපියල් හැත්තෑහයදහස් අටසිය අනූවයි ශත අසූතුනක (රු. 76,890.83) මුදල මත අයවිය යුතු වර්ෂයකට 17% බැගින් වන පොළියක් 2002.07.01 වැනි දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා අයකර ගැනීම සඳහා ද,

3. එකී 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තිය යටතේ අයකර ගත යුතු මුදල් සහ ගාස්තු අයකර ගැනීමට

දේපල පිළිබඳ විස්තරය

